# දකුණු පළාත් සභා නිලධාරීන්ගේ ස්ථාන මාරු පරිපාටිය

- ප්‍රධාන ලේකම් කාර්යාලය -

- දකුණු පළාත -

# පටුන


| | | | | පිටු අංකය |
|---|---|---|---|---|
| 01. | | හැඳින්වීම | - | 05 |
| 02. | | ස්ථාන මාරු සඳහා අදාළ වන දකුණු පළාත් රාජ්‍ය නිලධාරී සේවාවන් | - | 06 |
| 03. | | ස්ථාන මාරු කරනු ලබන නෛතික රාමුව හා පදනම | - | 06 |
| 04. | | වාර්ෂික ස්ථාන මාරු | - | 07 |
| | 04.01 | එක් එක් සේවා ස්ථානවල සම්පූර්ණ කළ යුතු සීමාවන් | - | 07 |
| | 04.02 | වාර්ෂික ස්ථාන මාරු කමිටු පිහිටුවීම | - | 08 |
| | 04.03 | වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන (අභියාචනා) කමිටු පිහිටුවීම | - | 12 |
| | 04.04 | වෘත්තිය සංගම් නිලධරයන් මාරු කිරීම | - | 14 |
| | 04.05 | වාර්ෂික ස්ථාන මාරු ලබා දීමේදී සැලකිල්ලට ගත යුතු වෙනත් පොදු කරුණු | - | 15 |
| | 04.06 | වාර්ෂික ස්ථාන මාරු කාලසටහන | - | 21 |
| | 04.07 | වාර්ෂික ස්ථාන මාරු නියෝගවලට විරුද්ධව දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අභියාචනා ඉදිරිපත් කිරීම | - | 23 |
| | 04.08 | වාර්ෂික ස්ථාන මාරු පිළිබඳ ව පසුවිපරම් කටයුතු සිදු කිරීම | - | 25 |
| 05. | | සේවා අවශ්‍යතා මත කරනු ලබන ස්ථාන මාරු | - | 26 |
| 06. | | විනය හේතු මත කරනු ලබන ස්ථාන මාරු | - | 28 |
| 07. | | රජයේ නිලධාරීන්ගේ ඉල්ලීම මත කරනු ලබන වාර්ෂික නොවන ස්ථාන මාරු | - | 30 |
| | 07.01 | සාමාන්‍ය ස්ථාන මාරු | - | 30 |
| | 07.02 | සුහද ස්ථාන මාරු | - | 33 |
| | 07.03 | ඉතා ප්‍රියමනාප සේවා ස්ථාන සඳහා නිලධාරීන් ස්ථාන මාරු කිරීම | - | 34 |
| | 07.04 | අන්තර් පළාත් හෝ මධ්‍යම රජයේ සේවයෙන් දකුණු පළාතට ස්ථාන මාරු වී පැමිණෙන නිලධාරීන් සම්බන්ධයෙන් ක්‍රියා කිරීම | - | 35 |
| | 07.05 | තාවකාලික ව අනුයුක්ත කිරීම | - | 35 |
| 08. | | සේවා අවශ්‍යතාවය මත, විනය හේතු මත හා වාර්ෂික නොවන ස්ථාන මාරු නියෝගවලට විරුද්ධව අභියාචනා ඉදිරිපත් කිරීම | - | 37 |
| 09. | | සියලු ස්ථාන මාරු සම්බන්ධයෙන් පොදු කොන්දේසි | - | 39 |
| 10. | | අර්ථ නිරූපණ | - | 41 |
| 11. | | අන්තර්කාලීන විධිවිධාන | - | 42 |
| 12. | | වෙනත් | - | 42 |
| 13. | | ආකෘති ලේඛනය | - | 43 |



චක්‍රලේඛ අංකය ස්ථාන මාරු /09
පළාත් ගරු ආණ්ඩුකාරතුමා
විසින් 23.06.14 දින අනුමත කොට ඇති බව
සහතික කරමු. පිටු 70 කි.
2023.06.19

# 1. හැඳින්වීම

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2022.12.14 දිනැති අංක 2310/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්ය පරිපාටික රීති 1 වැනි කාණ්ඩයේ XVIII වැනි පරිච්ඡේදයේ විධිවිධාන අනුව හා ආයතන සංග්‍රහයේ III වැනි පරිච්ඡේදය හා XXV වැනි පරිච්ඡේදයේ 7 වගන්තිය අනුව දකුණු පළාත් ප්‍රධාන ලේකම් පත්වීම් බලධරයා වන දකුණු පළාත් සභාවේ නිලධාරීන් සඳහා වන ස්ථාන මාරු පරිපාටිය වේ.

1.1. සෑම රජයේ නිලධරයෙක්ම ස්ථාන මාරු කිරීම්වලට යටත් වන්නේ ය.

1.2. සිරිත් පරිදි කෙරෙන කාර්යයක් වශයෙන් ස්ථාන මාරු කිරීමක් නොකළ යුතු ය. ස්ථාන මාරු කිරීමක් සිදු කළ යුත්තේ පහත 1.3. වගන්තියේ සඳහන් යම් කරුණක් මත පමණි.

1.3. ස්ථාන මාරු පහතින් සඳහන් කර ඇති සිව් ආකාර වන්නේ ය.

- I. වාර්ෂිකව කරනු ලබන ස්ථාන මාරු
- II. සේවා අවශ්‍යතා මත කරනු ලබන ස්ථාන මාරු
- III. විනය හේතු මත කරනු ලබන ස්ථාන මාරු
- IV. රජයේ නිලධරයන්ගේ ඉල්ලීම මත කරනු ලබන වාර්ෂික නොවන ස්ථාන මාරු

1.4. රජයේ නිලධරයෙකු ස්ථාන මාරු කරනු ලබන්නේ පහත සඳහන් අරමුණු සියල්ලම හෝ ඉන් කීපයක් හෝ ඉන් එකක් හෝ සපුරා ගැනීම සඳහා වන්නේ ය.

- I. ආයතනයක පවත්නා පුරප්පාඩුවක් පිරවීම.
- II. ආයතනයක පරිපාලන අවශ්‍යතා සපුරාලීම.
- III. ආයතනයේ කාර්යක්ෂමතාව හා ඵලදායිතාව ප්‍රවර්ධනය කිරීම.
- IV. අපේක්ෂිත විනය ක්‍රියාමාර්ගයක් සඳහා පහසුකම් සලසා දීම.
- V. විනය නියෝගයක් ක්‍රියාත්මක කිරීම.
- VI. නිලධරයාට පුළුල් විෂය ක්ෂේත්‍රයක අත්දැකීම් ලබා ගැනීමට අවස්ථාවක් සලසා දීම.
- VII. නිලධාරයාගේ වෘත්තිය සංවර්ධනයට හා ඔහුගේ දක්ෂතා ප්‍රවර්ධනයට අවස්ථාවක් සලසා දීම.
- VIII. නිලධරයාගේ පෞද්ගලික දුෂ්කරතාවයන්ට සහන සලසාදීම.

අනුමත අංකය ස්ථානමාරු / 09
දින 23.06.14 දින අනුමත කොට ඇති බව සහතික කරමු. පිටු 70
2023.06.19

## 2. ස්ථාන මාරු අදාළ වන දකුණු පළාත් රාජ්‍ය නිලධාරී සේවාවන්

2.1. කළමනාකරණ සේවා නිලධාරී සේවය (I, II හා III ශ්‍රේණිවල නිලධාරීන්)
2.2. සංවර්ධන නිලධාරී සේවය (I, II හා III ශ්‍රේණිවල නිලධාරීන්)
2.3. වැඩසටහන් සහකාර/ සංවර්ධන සහකාර (I, II හා III ශ්‍රේණිවල නිලධාරීන්)
2.4. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර සේවය (03 වන පන්තියේ නිලධාරීන්)
2.5. රියදුරු සේවය (I, II, III හා විශේෂ ශ්‍රේණිවල නිලධාරීන්)
2.6. කාර්යාල සේවක සේවය (I, II, III හා විශේෂ ශ්‍රේණිවල නිලධාරීන්)

## 3. ස්ථාන මාරු කරනු ලබන නෛතික රාමුව හා පදනම

3.1. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154අ. ව්‍යවස්ථාව ප්‍රකාර ව පිහිටුවන ලද දකුණු පළාත් සභාවේ, 1987 අංක 42 දරන පළාත් සභා පනතේ IV වන කොටසේ 32(2) ප්‍රකාර ව දකුණු පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධරයන් මාරු කිරීමේ බලතල ගරු දකුණු පළාත් ආණ්ඩුකාරවරයා වෙත පවරා දී ඇති අතර, 1990 අංක 28 දරන පළාත් සභා (සංශෝධන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාර ව එකී බලතල ගරු දකුණු පළාත් ආණ්ඩුකාරවර විසින් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අවස්ථානුකූල ව පවරා දිය හැකි ය.

3.2. එකී පළාත් සභා පනතේ ප්‍රතිපාදන අනුව තවදුරටත් දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් ම ක්‍රියාත්මක කරනු ලබන සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට හෝ වෙනත් නිලධරයෙකුට අභිනියෝජනය කරන ලද බලතල දක්වමින් 2019.06.01 දිනැති දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2019 නිකුත් කර ඇත. එකී බලතල පැවරීම ප්‍රකාර ව අදාළ බලධාරීන් විසින් ස්ථාන මාරු සිදුකිරීම අපේක්ෂා කෙරේ.

එසේම,

3.3. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2022.12.14 දිනැති අංක 2310/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්ය පරිපාටික රීති 1 වැනි කාණ්ඩයේ XVIII වැනි පරිච්ඡේදයේ 246 හා 247 රීතීන්හි විධිවිධාන අනුව අවස්ථාවෝචිත පරිදි ස්ථාන මාරු සිදුකළ යුතු ය.

සහ,

3.4. ආයතන සංග්‍රහයේ III වැනි පරිච්ඡේදයේ 1.1 වගන්තිය අදාළ වේ.

අනුමත අංකය ස්ථාන මාරු / 09
...න් ගරු ආන්ඩුකාරතුමා
23.06.14 දින අනුමත කොට ඇති බව
...කරමු. පිටු 70 කි
2023.06.19

# 4. වාර්ෂික ස්ථාන මාරු

**4.A.** දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ 2019.06.01 දිනැති හා අංක 01/2019 දරන බලතල පැවරීමේ චක්‍රලේඛයේ උප ලේඛන V හි සඳහන් විධිවිධාන අනුව ඉහත 2.1, 2.4, 2.5 හා 2.6 දරන සේවාවන්හි වාර්ෂික ස්ථාන මාරු පළමුව අමාත්‍යාංශ වාර්ෂික ස්ථාන මාරු මණ්ඩලය මගින් ද දෙවනුව ප්‍රධාන ලේකම් වාර්ෂික ස්ථාන මාරු මණ්ඩලය මගින් ද සිදු කරනු ලැබේ.

**4.B.** (වාර්ෂික ස්ථාන මාරු ඉහත 4.A. පරිදි සිදු කරන්නේද නැතහොත් ප්‍රධාන ලේකම් මාරු මණ්ඩලය මගින් පමණක් සිදුකරන්නේ ද යන්න සම්බන්ධයෙන් අදාළ වර්ෂයේ වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛයේ නියමයන් පරිදි කටයුතු කළ යුතු ය.)

**4.C.** දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ 2021.03.31 දිනැති හා අංක 01/2019(VI) දරන බලතල පැවරීමේ (උප ලේඛන V) සංශෝධිත චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන අනුව ඉහත 2.2 හා 2.3 දරන සේවාවන්හි වාර්ෂික ස්ථාන මාරු ප්‍රධාන ලේකම් වාර්ෂික ස්ථාන මාරු මණ්ඩලය මගින් පමණක් සිදු කරනු ලැබේ.

## 4.1. එක් එක් සේවා ස්ථානවල සම්පූර්ණ කළ යුතු කාල සීමාවන්

**4.1.1.** කිසියම් සේවා ස්ථානයක අවුරුදු 05ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරිහු ස්ථාන මාරුවීම් ඉල්ලා සිටීම සඳහා සුදුසුකම් ලබන අතර, එම නිලධාරීන් අනිවාර්යයෙන් ස්ථාන මාරු අයදුම් කළ යුතු ය.

**4.1.2.** කෙසේ වෙතත්, ස්ථාන මාරුවීම් අපේක්ෂා කරන නිලධාරීන් සිටී නම් සේවා කාලය නොසලකා ස්ථාන මාරු ඉල්ලා සිටිය හැකි නමුත් අවුරුදු 05ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් සඳහා ප්‍රමුඛතාවය ලබා දිය යුතුය.

**4.1.3.** ඉතා ප්‍රියමනාප සේවා ස්ථානයක අවුරුදු 03ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරිහු අනිවාර්යයෙන් ස්ථාන මාරු වලට යටත් වේ.

**4.1.A.** යම් සේවා ස්ථානයක සේවා කාලය මත අනිවාර්යයෙන් ස්ථාන මාරු අයදුම් කළ යුතු වුවද, එසේ ස්ථාන මාරුවීම් අයදුම් නොකළ නිලධාරීන් ස්ථාන මාරු කළ විට ඔවුන් විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචනා සම්බන්ධයෙන් සලකා බලනු නොලැබේ.

**4.1.B.** ඉතා ප්‍රියමනාප, ප්‍රියමනාප හා අනෙකුත් සේවා ස්ථාන සම්බන්ධයෙන් අදාළ වර්ෂයේ වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛයේ නියමයන් පරිදි කටයුතු කළ යුතු ය.

ස්ථානමාරු / 09
... ආණ්ඩුකාරතුමා
23 . 06 . 14 දින අනුමත කොට ඇති බව
සහතික කරමු. පිටු 70 කි.
2023 . 06 . 19

## 4.2. වාර්ෂික ස්ථාන මාරු කමිටු පිහිටුවීම

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2022.12.14 දිනැති අංක 2310/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්ය පරිපාටික රීති 1 වැනි කාණ්ඩයේ XVIII වැනි පරිච්ඡේදයේ 250 රීතියේ විධිවිධාන අනුව වාර්ෂික ස්ථාන මාරු කමිටු පිහිටුවිය යුතු ය.

ඒ අනුව, පහත පරිදි වාර්ෂික ස්ථාන මාරු කමිටු පිහිටුවිය හැකිය.

### 4.2.1. අමාත්‍යාංශ වාර්ෂික ස්ථාන මාරු කමිටු

I. අදාළ අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින දෙපාර්තමේන්තු හා ආයතනයන්හි වාර්ෂික ස්ථාන මාරු වීම් අදාළ අමාත්‍යාංශය මගින් පමණක් සිදු කළ යුතු ය.

II. එහිදී ස්ථාන මාරුවීම් සඳහා සුදුසුකම් ලබන අයදුම්කරුවන් සංඛ්‍යාව සැලකිල්ලට ගෙන ඒ ඒ සේවාවන් සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් (ස්ථාන මාරුවීම් සඳහා සුදුසුකම් ලබන නිලධාරීන් 50 දෙනෙකු හෝ ඊට වැඩි ගණනක්) සිටී නම් අදාළ සේවාවන් සඳහා වෙන වෙනම වාර්ෂික ස්ථාන මාරු කමිටු පිහිටු විය යුතු ය.

III. එසේ වුවද, අමාත්‍යාංශයක් හෝ දෙපාර්තමේන්තුවක් තුළ පවත්නා විශේෂ තත්ත්ව මත 50 දෙනෙකුට වඩා අඩු නිලධර සංඛ්‍යාවක් සඳහා වුවද වාර්ෂික ස්ථාන මාරු කමිටුවක් ස්ථාපනය කිරීම සඳහා තම අභිමතය පරිදි ක්‍රියා කිරීමට අදාළ අමාත්‍යාංශ ලේකම් හට හැකියාව පවතී.

IV. යම් සේවා ස්ථානයක ස්ථාන මාරුවීමට සුදුසුකම් ලබන නිලධාරීන් බහුතරයක් සිටී නම්, එම සේවා ස්ථානයේ කාර්යයන්ට හානියක් නොවන පරිදි ස්ථාන මාරුවීම් සිදු කිරීම සඳහා වාර්ෂික ස්ථාන මාරු කමිටු හැකි සෑම ආකාරයකින්ම කටයුතු කළ යුතු ය.

V. අදාළ වාර්ෂික ස්ථාන මාරු කමිටු සහ සමාලෝචන කමිටු සඳහා කම්කරු දෙපාර්තමේන්තුවෙහි ලියාපදිංචි වී ඇති හා අදාළ වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛයේ සඳහන් කර ඇති වර්ෂයන් සඳහා කම්කරු දෙපාර්තමේන්තුවෙහි ලියාපදිංචිය යාවත්කාලීන කරන ලද (4.2.1.VI අනුව) පිළිගත් වෘත්තීය සමිති නියෝජිතයන් සඳහා අනිවාර්යයෙන්ම කැඳවීම් සිදු කළ යුතු ය.

VI. වෘත්තිය සමිති විසින් තම වෘත්තිය සමිතියේ සාමාජික ලේඛනය, ගිණුම් වාර්තා, N වාර්තා (වාර්ෂික මහා සභා වාර්තාව / සම්මේලන වාර්තාව), L වාර්තා (වෘත්තිය සමිතියේ නිලධාරීන් වෙනස්වීම පිළිබඳ වාර්තාව) වාර්ෂිකව කම්කරු දෙපාර්තමේන්තුවට ලබා දී ඇති බවට කම්කරු දෙපාර්තමේන්තුවෙන් තහවුරු කර ගැනීමක් සිදුකළ යුතු ය.

අනුමත අංකය ස්ථානමාරු / 09
...ත් ගරු ...ආනන්ද කුමාරතුමා...
2023.06.14 දින අනුමත කොට ඇති බව
සහතික කරමි. පිටු 70 කි.
2023.06.19

**4.2.1.1. කළමනාකරණ සේවා නිලධාරී / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර/ රියදුරු / කාර්යාල සේවක සේවය යන සේවාවන්ට අදාළ වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ සංයුතිය**

i. සභාපති - අමාත්‍යාංශ ලේකම් විසින් නම් කළ ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියෙක්

ii. සෑම දෙපාර්තමේන්තුවක්ම නියෝජනය වන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානී විසින් නම් කළ ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියෙක්

iii. (අ) ඉහත 2.1, 2.4, 2.5 හා 2.6 යටතට ගැනෙන සේවාවන්ට අයත් මුළු නිලධර සංඛ්‍යාවෙන් අවම වශයෙන් 15%ක් හෝ ඊට වැඩි සාමාජික පිරිසක් සිටින සෑම වෘත්තිය සමිතියක් විසින්ම දිස්ත්‍රික් පදනමින් නම් කළ නියෝජිතයෙකු බැගින්

හෝ

(ආ) පූර්ණකාලීන ව වෘත්තිය සමිති කටයුතු සඳහා නිලධාරියෙකු මුදා හැර ඇති සෑම වෘත්තිය සමිතියකම දිස්ත්‍රික් පදනමින් නම් කළ නියෝජිතයෙකු බැගින්

**4.2.2. <u>ප්‍රධාන ලේකම් වාර්ෂික ස්ථාන මාරු කමිටු</u>**

I. අමාත්‍යාංශ අතර, අමාත්‍යාංශ යටතට නොගැනෙන දෙපාර්තමේන්තු හා වෙනත් ආයතනවල ප්‍රධාන ලේකම් වාර්ෂික ස්ථාන මාරු කමිටුවට යොමු කළ යුතු නිලධාරීන්ගේ ස්ථාන මාරු සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ය.

II. ස්ථාන මාරු සඳහා සුදුසුකම් ලබන අයදුම්කරුවන් සංඛ්‍යාව සැලකිල්ලට ගෙන ඒ ඒ සේවාවන් සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් (ස්ථාන මාරුවීම් සඳහා සුදුසුකම් ලබන නිලධාරීන් 50 දෙනෙකු හෝ ඊට වැඩි ගණනක්) සිටී නම් අදාළ සේවාවන් සඳහා වෙන වෙනම වාර්ෂික ස්ථාන මාරු කමිටු පිහිටුවිය යුතු ය.

III. එසේ වුවද, අමාත්‍යාංශයක් හෝ දෙපාර්තමේන්තුවක් තුළ පවත්නා විශේෂ තත්ත්ව මත 50 දෙනෙකුට වඩා අඩු නිලධර සංඛ්‍යාවක් සඳහා වුවද වාර්ෂික ස්ථාන මාරු කමිටුවක් ස්ථාපනය කිරීම සඳහා තම අභිමතය පරිදි ක්‍රියා කිරීමට දකුණු පළාත් ප්‍රධාන ලේකම් හට හැකියාව පවතී.

IV. යම් සේවා ස්ථානයක ස්ථාන මාරුවීමට සුදුසුකම් ලබන නිලධාරීන් බහුතරයක් සිටී නම්, එම සේවා ස්ථානයේ කාර්යයන්ට හානියක් නොවන පරිදි ස්ථාන මාරුවීම් සිදු කිරීම සඳහා ස්ථාන මාරු කමිටු හැකි සෑම ආකාරයකින්ම කටයුතු කළ යුතු ය.

ස්ථානමාරු / 09
2023.06.14 දින අනුමත කොට ඇති බව සහතික කරමු. පිටු 70 කි.
2023.06.19

V. අදාළ වාර්ෂික ස්ථාන මාරු කමිටු සහ සමාලෝචන කමිටු සඳහා කම්කරු දෙපාර්තමේන්තුවෙහි ලියාපදිංචි වී ඇති හා අදාළ වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛයේ සඳහන් කර ඇති වර්ෂයන් සඳහා කම්කරු දෙපාර්තමේන්තුවෙහි ලියාපදිංචිය යාවත්කාලීන කරන ලද (4.2.2.VI අනුව) පිළිගත් වෘත්තීය සමිති නියෝජිතයන් සඳහා අනිවාර්යයෙන්ම කැඳවීම් සිදු කළ යුතු ය.

VI. වෘත්තිය සමිති විසින් තම වෘත්තිය සමිතියේ සාමාජික ලේඛනය, ගිණුම් වාර්තා, N වාර්තා (වාර්ෂික මහා සභා වාර්තාව / සම්මේලන වාර්තාව), L වාර්තා (වෘත්තිය සමිතියේ නිලධාරීන් වෙනස්වීම පිළිබඳ වාර්තාව) වාර්ෂිකව කම්කරු දෙපාර්තමේන්තුවට ලබා දී ඇති බවට කම්කරු දෙපාර්තමේන්තුවෙන් තහවුරු කර ගැනීමක් සිදුකළ යුතු ය.

**4.2.2.1. සංවර්ධන නිලධාරී / වැඩසටහන් සහකාර/ සංවර්ධන සහකාර සේවාවන්ට අදාළ ප්‍රධාන ලේකම් වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ සංයුතිය**

i. සභාපති - සහකාර ප්‍රධාන ලේකම් (පාලන)
ii. අමාත්‍යාංශ පහ (05) නියෝජනය වන පරිදි අදාළ අමාත්‍යාංශ ලේකම් විසින් නම් කළ ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියෙක්
iii. ප්‍රධාන ලේකම් විසින් නම් කරන ලද එම කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු
iv. (අ) ඉහත 2.2 හා 2.3 යටතට ගැනෙන සේවාවන්ට අයත් මුළු නිලධර සංඛ්‍යාවෙන් අවම වශයෙන් 15%ක් හෝ ඊට වැඩි සාමාජික පිරිසක් සිටින සෑම වෘත්තිය සමිතියක් විසින්ම දිස්ත්‍රික් පදනමින් නම් කළ නියෝජිතයෙකු බැගින්

හෝ

(ආ) පූර්ණකාලීන ව වෘත්තිය සමිති කටයුතු සඳහා නිලධාරියෙකු මුදා හැර ඇති සෑම වෘත්තිය සමිතියකම දිස්ත්‍රික් පදනමින් නම් කළ නියෝජිතයෙකු බැගින්

**4.2.2.2. කළමනාකරණ සේවා නිලධාරී / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර / රියදුරු / කාර්යාල සේවක සේවය යන සේවාවන්ට අදාළ ප්‍රධාන ලේකම් වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ සංයුතිය**

i. සභාපති - සහකාර ප්‍රධාන ලේකම් (පාලන)
ii. ප්‍රධාන ලේකම් විසින් නම් කරන ලද එම කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු
iii. (අ) ඉහත 2.1, 2.4, 2.5 හා 2.6 යටතට ගැනෙන සේවාවන්ට අයත් මුළු නිලධර සංඛ්‍යාවෙන් අවම වශයෙන් 15%ක් හෝ ඊට වැඩි සාමාජික පිරිසක් සිටින සෑම වෘත්තිය සමිතියක් විසින්ම දිස්ත්‍රික් පදනමින් නම් කළ නියෝජිතයෙකු බැගින්

හෝ

(ආ) පූර්ණකාලීන ව වෘත්තිය සමිති කටයුතු සඳහා නිලධාරියෙකු මුදා හැර ඇති සෑම වෘත්තිය සමිතියකම දිස්ත්‍රික් පදනමින් නම් කළ නියෝජිතයෙකු බැගින්

අනුමත අංකය ස්ථානමාරු / 09
ආණ්ඩුකාරතුමා
2023 . 06 . 14 දින අනුමත කොට ඇති බව
කරමු.පිටු 70
2023 . 06 . 19

4.2.A.ස්ථාන මාරු කමිටු පිහිටුවීම සම්බන්ධයෙන් අදාළ වර්ෂයේ වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛයේ නියමයන් පරිදි කටයුතු කළ යුතු ය.

4.2.B.දකුණු පළාත් සභාවේ රජයේ නිලධරයන්ගෙන් අවම වශයෙන් 15%ක නියෝජනයක් සහිත වෘත්තිය සමිතියක් විසින් නම් කළ නියෝජිතයෙක් මාරු කමිටුවට සහභාගී කර ගැනීමේදී, වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛය නිකුත් කරන දිනට අවම වශයෙන් 15%ක නියෝජනයක් සහිත වෘත්තිය සමිති සහභාගී කරවාගත යුතු ය.

4.2.C.පූර්ණකාලීනව වෘත්තිය සමිති කටයුතු සඳහා නිලධාරියෙකු මුදා හැර ඇති සෑම වෘත්තිය සංගමයකම නම් කළ නියෝජිතයෙක් මාරු කමිටුවට සහභාගී කර ගැනීමේදී, එම පූර්ණකාලීනව මුදා හැර ඇති නිලධාරියා හෝ නම් කරන ලද නියෝජිතයා දකුණු පළාත් සභාවේ ඉහත 2. යටතට ගැනෙන සේවාවන්ට අයත් අදාළ සේවාවේ නිලධාරියෙකු විය යුතුය.

4.2.D.වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛය මගින් ප්‍රධාන ලේකම් මාරු කමිටු මගින් පමණක් වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කරන ලෙස උපදෙස් ලබා දී ඇත්නම්, ඉහත 4.2.2.2. සඳහා සෑම අමාත්‍යාංශයක්ම නියෝජනය වන පරිදි අමාත්‍යාංශ ලේකම් හෝ අමාත්‍යාංශ ලේකම් විසින් නම් කළ නියෝජිතයෙක් බැගින් සහභාගී කරවා ගත යුතු ය.

4.2.E.වාර්ෂික ස්ථාන මාරු කමිටු සඳහා සහභාගී වන සියලුම නිලධාරීන් හා වෘත්තිය සමිති නියෝජිතයන් විසින් රහස්‍යභාවය සුරකින බවට ලිඛිත ප්‍රකාශයක් ( ආකෘති අංක 05 ) ලබා දිය යුතු අතර, රහස්‍යභාවය සුරැකීමට කටයුතු නොකරන නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූල පියවර ගත හැකි ය.

4.2.F.වාර්ෂික ස්ථාන මාරු කමිටු තීරණ ලබා ගැනීමේදී, ස්ථාන මාරු විෂය නිලධාරීන්ගෙන් ගොනුගත කරුණු විමසා බැලීමේ හැකියාව අදාළ ස්ථාන මාරු කමිටුවේ සභාපති හට පවතී.

ස්ථානමාරු 109
ආචාර්යතුමා
2023. 06. 14 දින අනුමත කොට ඇති බව
සංයතික කරමු. පිටු 70 කි.
2023. 06. 19

## 4.3. වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන (අභියාචනා) කමිටු පිහිටුවීම

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2022.12.14 දිනැති අංක 2310/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්ය පරිපාටික රීති 1 වැනි කාණ්ඩයේ XVIII වැනි පරිච්ඡේදයේ 254 රීතියේ විධිවිධාන අනුව වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු පිහිටුවිය යුතු ය.

ස්ථාන මාරු නියෝගයන් සම්බන්ධයෙන් කෙරෙන අභියාචනා සලකා බැලීම සඳහා වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන කමිටු විසින් පහත සඳහන් කරුණු පිළිබඳ පරීක්ෂා කර තීරණ ගනු ඇත.

i. ප්‍රකාශයට පත් කරන ලද වාර්ෂික ස්ථාන මාරු මෙම චක්‍රලේඛයට අනනුකූල වන අවස්ථාවලදී
ii. ස්ථාන මාරුවීම් අයදුම් කරන ලද දිනයෙන් පසුව නිලධාරීන්ට සිදු වූ හදිසි විපත් කරදර අසනීප වැනි සානුකම්පිත තත්වයන් සම්බන්ධයෙන් පිළිගත හැකි නිර්දේශ ඉදිරිපත් කර ඇත්නම් ඒවා පිළිබඳව
iii. අන්තර් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු අතර ඇතිවිය හැකි සුවිශේෂී අවශ්‍යතාවලදී

ඒ අනුව, පහත පරිදි සමාලෝචන කමිටු පිහිටුවිය හැකිය.

### 4.3.1. අමාත්‍යාංශ වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන (අභියාචනා) කමිටු

I. අමාත්‍යාංශ වාර්ෂික ස්ථාන මාරු කමිටුව මගින් ස්ථාන මාරු ලබා දී ඇති නිලධාරීන්ගේ අභියාචනා සම්බන්ධයෙන් කටයුතු කිරීම.

**4.3.1.1. කළමනාකරණ සේවා නිලධාරී / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර / රියදුරු / කාර්යාල සේවක සේවය යන සේවාවන්ට අදාළ වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන කමිටුවේ සංයුතිය**

i. සභාපති - පළාත් අමාත්‍යාංශ ලේකම්
ii. සෑම දෙපාර්තමේන්තුවක්ම නියෝජනය වන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**4.3.1.A. වාර්ෂික ස්ථාන මාරු කමිටුවට සහභාගී වූ වෘත්තීය සමිති නියෝජිතයන් හට වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන කටයුතු සඳහා නිරීක්ෂණ මට්ටමින් සහභාගී වීමට අවස්ථාව ලබාදිය හැකිය.**

**4.3.1.B. වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන කමිටු තීරණ ලබා ගැනීමේදී, අදාළ මාණ්ඩලික නිලධාරීන්ගෙන් හා ස්ථාන මාරු විෂය භාර නිලධාරීන්ගෙන් ගොනුගත කරුණු විමසා බැලීමේ හැකියාව අදාළ ස්ථාන මාරු සමාලෝචන කමිටුවේ සභාපති හට පවතී.**

අනුමත අංකය ස්ථානමාරු / 09
2023.06.14 දින අනුමත කොට ඇති සිට
70
2023.06.19
ආණ්ඩුකාර ලේකම්

### 4.3.2. ප්‍රධාන ලේකම් වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන (අභියාචනා) කමිටු

I. ප්‍රධාන ලේකම් වාර්ෂික ස්ථාන මාරු කමිටුව මගින් ස්ථාන මාරු ලබා දී ඇති නිලධාරීන්ගේ අභියාචනා සම්බන්ධයෙන් කටයුතු කිරීම.

II. අමාත්‍යාංශ අභියාචනා කමිටු තීරණ සම්බන්ධයෙන් තවදුරටත් අභියාචනා සිදුකරන නිලධාරීන්ගේ අභියාචනා සම්බන්ධයෙන් කටයුතු කිරීම.

**4.3.2.1. සංවර්ධන නිලධාරී / වැඩසටහන් සහකාර/ සංවර්ධන සහකාර සේවාවන්ට අදාළ ප්‍රධාන ලේකම් වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන කමිටුවේ සංයුතිය**

i. සභාපති - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)
ii. අමාත්‍යාංශ පහ (05) නියෝජනය වන පරිදි පළාත් අමාත්‍යාංශ ලේකම්වරු
iii. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)
iv. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්)
v. සහකාර ප්‍රධාන ලේකම් (පාලන)

**4.3.2.2. කළමනාකරණ සේවා නිලධාරී / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර / රියදුරු / කාර්යාල සේවක සේවය යන සේවාවන්ට අදාළ ප්‍රධාන ලේකම් වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන කමිටුවේ සංයුතිය**

i. සභාපති - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)
ii. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)
iii. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්)
iv. සහකාර ප්‍රධාන ලේකම් (පාලන)

**4.3.2.A. වාර්ෂික ස්ථාන මාරු කමිටුවට සහභාගී වූ වෘත්තීය සමිති නියෝජිතයන් හට වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන කටයුතු සඳහා නිරීක්ෂණ මට්ටමින් සහභාගී වීමට අවස්ථාව ලබාදිය හැකිය.**

**4.3.2.B. වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛයෙන් ප්‍රධාන ලේකම් අභියාචනා කමිටුව මගින් පමණක් වාර්ෂික ස්ථාන මාරු අභියාචනා සලකා බලන ලෙස උපදෙස් ලබා දී ඇත්නම්, ඉහත 4.3.2.2. සඳහා සෑම අමාත්‍යාංශයක්ම නියෝජනය වන පරිදි අමාත්‍යාංශ ලේකම්වරු සහභාගී කරවා ගත යුතු ය.**

**4.3.2.C. වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන කමිටු තීරණ ලබා ගැනීමේදී, අදාළ මාණ්ඩලික නිලධාරීන්ගෙන් හා ස්ථාන මාරු විෂය භාර නිලධාරීන්ගෙන් ගොනුගත කරණු විමසා බැලීමේ හැකියාව අදාළ ස්ථාන මාරු සමාලෝචන කමිටුවේ සභාපති හට පවතී.**

ස්ථානමාරු 109
...භාර ...ආරක්ෂකතාරතුමා
2023.06.14 දින අනුමත කොට ඇති බව
සංඝටිත කරමු.පිටු 70 කි.
2023.06.19

## 4.4. වෘත්තිය සංගම් නිලධරයන් මාරු කිරීම

වෘත්තිය සංගම් නිලධරයන් මාරු කිරීමේදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2022.12.14 දිනැති අංක 2310/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්ය පරිපාටික රීති 1 වැනි කාණ්ඩයේ XVIII වැනි පරිච්ඡේදයේ 272 රීතියේ සිට 277 රීතිය දක්වා සඳහන් විධි විධාන අනුව හා ආයතන සංග්‍රහයේ XXV වැනි පරිච්ඡේදයේ 7 කොටසේ සඳහන් විධි විධාන අනුව කටයුතු කළ යුතු වේ.

ඒ අනුව,

**4.4.1.** මෙම ස්ථාන මාරු කිරීම් පරිපාටියේදී වෘත්තිය සංගමය යනුවෙන් හැඳින්වෙන්නේ එක් සේවාවක් පමණක් නියෝජනය කරනු ලබන විධිමත් පරිදි කම්කරු දෙපාර්තමේන්තුවෙහි ලියාපදිංචි වී ඇති හා අදාළ වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛයේ සඳහන් කර ඇති වර්ෂයන් සඳහා 4.2.1. VI හා 4.2.2. VI පරිදි කම්කරු දෙපාර්තමේන්තුවෙහි ලියාපදිංචිය යාවත්කාලීන කරන ලද බවට තහවුරු කරන වෘත්තිය සමිති වේ.

**4.4.2.** දකුණු පළාත් ප්‍රධාන ලේකම් විසින් පිළිගත් ප්‍රස්තුත සේවයේ වෘත්තිය සමිතියක මව් සංගමයේ සභාපති/ ලේකම්/ භාණ්ඩාගාරික/ හා මධ්‍ය විධායක මණ්ඩලයේ සභිකයන් මාරු කරන්නේ නම් අදාළ වෘත්තීය සංගමයේ ලේකම්ගේ නිර්දේශය සැළකිල්ලට ගතයුතු වේ.

**4.4.3.** මෙම අනුග්‍රහය ලබාගැනීමට අපේක්ෂා කරන සියලුම වෘත්තිය සමිති තම වෘත්තිය සමිති නිලධාරීන් පිළිබඳ විස්තර රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2022.12.14 දිනැති අංක 2310/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්ය පරිපාටික රීති 1 වැනි කාණ්ඩයේ XVIII වැනි පරිච්ඡේදයේ 276 රීතියේ හා ආයතන සංග්‍රහයේ XXV පරිච්ඡේදයේ 7:5 වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාර ව (එනම්, මෙම අනුග්‍රහය ලබා දීමට බලාපොරොත්තු වන නිලධාරීන්ගේ නම්, එම එක් එක් නිලධාරියා පත්කළ යුතු සේවා ස්ථාන සහ වෘත්තිය සමිතියේ සාමාජික සංඛ්‍යාව ඇතුළත් ඉල්ලුම් පත්‍රයක්), උපරිමය නිලධාරීන් 04 දෙනෙකුට යටත් ව අදාළ වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛය නිකුත් කළ දින සිට මසක් ඉක්මවීමට පෙර දකුණු පළාත් ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු ය.

**4.4.4.** ඉතා ප්‍රියමනාප සේවා ස්ථානයක සේවය කරන නිලධරයන් සඳහා මෙම අනුග්‍රහය අදාල නොවේ.

**4.4.5.** යම් වෘත්තිය සමිතියක් විසින් මෙම අනුග්‍රහය ලබා දීමට බලාපොරොත්තු වන නිලධාරීන් නම් කිරීමේදී, එම නිලධාරීන් පත්කළ යුතු සේවා ස්ථාන ලෙස ඉතා ප්‍රියමනාප සේවා ස්ථාන සඳහන් කිරීමේ හැකියාවක් නොමැත.

අනුමත අංකය ස්ථානමාරු / 09
ගොනු අංකය ...
2023.06.14 දින අනුමත කොට ඇති බව
සහතික කරමු. පිටු 70
2023.06.19
ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

4.4.6. මෙම අනුග්‍රහය යටතේ යම් සේවා ස්ථානයකට පත්කරන ලද නිලධාරියෙකු එකී අනුග්‍රහය ලබා දුන් නිලයෙන් ගිලිහුණු විට හෝ ඉහළ තනතුරකට, පන්තියකට නැතහොත් ශ්‍රේණියකට උසස් වූ විට හෝ, එම නිලධාරියා සාමාන්‍ය ව්‍යවස්ථා යටතේ ස්ථාන මාරු කරනු ලැබීමට යටත් වන්නේ ය.

4.4.7. සෑම විටම මෙම අනුග්‍රහය දිය යුත්තේ සේවයේ හදිසි අවශ්‍යතාවයන්ට හා විනය පිළිබඳ වූ නියමයන්ට යටත්ව ය.

## 4.5. වාර්ෂික ස්ථාන මාරු ලබා දීමේදී සැලකිල්ලට ගත යුතු වෙනත් පොදු කරුණු

4.5.1. කිසියම් සේවා ස්ථානයක අවුරුදු 05ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන්ගේ ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී මාර්ගගතව (Online) අදාළ වර්ෂයේ වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛයේ නියමයන් පරිදි ඉදිරිපත් කළ යුතු ය.

4.5.2. යම් සේවා ස්ථානයක නිලධාරියෙකු 4.1.1. හි සඳහන් නියමිත කාලය ඉක්මවා සේවය කළද එම සේවා ස්ථානය ප්‍රියමනාප හෝ ඉතා ප්‍රියමනාප සේවා ස්ථානයක් ලෙස වර්ගීකරණය කර නොමැති නම්, එම නිලධාරියා ස්ථාන මාරු වීමට අපේක්ෂා නොකරන්නේ නම් ද ආයතන ප්‍රධානියා විසින් ස්ථාන මාරු කළ යුතු බවට නිර්දේශ නොකරන්නේ නම් ද විගණන හෝ විනය පිළිබඳ ගැටළු නොවන්නේ නම් ද, එකී නිලධාරියා ස්ථාන මාරු නොකර සිටීමට මාරු මණ්ඩලයට තීරණය කළ හැකිය.

4.5.3. එසේ වුවද 4.1.1. ඡේදය යටතට ගැනෙන වෙනත් නිලධාරියෙකු විසින් වාර්ෂික ස්ථාන මාරු සඳහා සුදුසුකම් ලැබීම හේතුවෙන් ඉහත 4.5.2. හි සඳහන් කරන ලද නිලධාරියාගේ සේවා ස්ථානයට ස්ථාන මාරු ඉල්ලුම් කර ඇති විට, එම සේවා ස්ථානයේ සේවය කරනු ලබන නමුත් වාර්ෂික ස්ථාන මාරු අපේක්ෂා නොකරන වසර 05 ඉක්ම වූ නිලධාරීන් අතුරින් වැඩිම සේවා කාලයක් සේවය කර ඇති නිලධාරියා ස්ථාන මාරු සඳහා යටත්කොට බාහිරින් එම සේවා ස්ථානයට මාරුවීමක් අපේක්ෂා කරන නිලධාරීන්ට අවස්ථාව ලබාදිය යුතු ය.

4.5.4. ඉහත 4.5.3.ට අදාළව එසේ මාරුවීමක් ලබා දීමට යටත් වන නිලධාරියාට එම සේවා ස්ථානය ආසන්න සේවා ස්ථානයක් ලබා දීමට හැකි සෑම උත්සාහයක් ම දැරිය යුතු ය. (මෙහිදී නිලධාරීන්ගේ පදිංචිය, දරුවන්ගේ පාසල් පිහිටි ප්‍රදේශය, සඳහන් කර ඇති වෙනත් පෞද්ගලික අපහසුතා ආදී කරුණු පිළිබඳ සැලකිල්ලට ගනිමින් ස්ථාන මාරු ගැලපීම් සිදුකිරීමට සෑම උත්සාහයක් ම දැරිය යුතු ය.)

අනුමත අංකය ස්ථානමාරු / 09
[illegible] ගරු [illegible]
විසින් 2023.06.14 දින අනුමත කොට ඇති බව
සහතික කරමු. පිටු 70 කි.
2023.06.19

**4.5.5.** ඉතා ප්‍රියමනාප සේවා ස්ථානයක අවුරුදු 03ක සේවා කාලයක් සම්පූර්ණ නොකරන ලද යම් නිලධාරියෙක් ස්ථාන මාරුවක් ඉල්ලා සිටින්නේ නම්, පරිපාලන හා සේවා අවශ්‍යතාවයන්ට යටත්ව එවැනි ස්ථාන මාරුවක් ලබා දිය හැකිය.

**4.5.6.** **ඉතා ප්‍රියමනාප සේවා ස්ථානයන් වෙත ඉල්ලුම් කරන ලද ස්ථාන මාරු අයදුම්පත් සංඛ්‍යාව මත වයස අවුරුදු 45ට වැඩි හා වයස අවුරුදු 45ට අඩු නිලධාරීන් අතුරින් වැඩිම සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියා හට 3:2 අනුපාතික ක්‍රමයට හෝ ස්ථාන මාරු සිදුකරන නිලධාරීන්ගේ ශ්‍රේණිවලට අදාළව හෝ එම ක්‍රම දෙකම ප්‍රකාරව වඩාත් සුදුසු ක්‍රමවේදයට හෝ ස්ථාන මාරු ලබාදීමට කටයුතු කළ යුතු ය.**

**4.5.7.** **ඉතා ප්‍රියමනාප සේවා ස්ථානයන් වෙත නිලධරයන් ස්ථාන මාරු කිරීමේදී වසර 05ක හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් සඳහා ප්‍රමුඛතාවය ලබා දීම අනිවාර්යය වේ.**

**4.5.8.** **ඉතා ප්‍රියමනාප සේවා ස්ථානයක සේවය කරන නිලධාරියෙකු එවැනිම වෙනත් කාර්යාලයකට ස්ථාන මාරු නොකළ යුතු ය. (යම් නිලධාරියෙකුට සිය සේවා කාලය තුළ එක් අවස්ථාවකදී පමණක් ඉතා ප්‍රියමනාප සේවා ස්ථානයක සේවය කළ හැකිය.)**

**4.5.9.** ප්‍රියමනාප සේවා ස්ථාන වලට ප්‍රියමනාප නොවන සේවා ස්ථානවල සේවය කරන නිලධාරීන් විසින් කරනු ලබන ස්ථාන මාරු ඉල්ලීම් සඳහා ප්‍රමුඛතාවය ලබා දීමෙන් පසුව, ප්‍රියමනාප සේවා ස්ථානවල සේවය කරන නිලධාරීන් විසින් නැවත ප්‍රියමනාප සේවා ස්ථානයකට කරනු ලබන ස්ථාන මාරු ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා බැලිය හැකිය.

**4.5.10.** වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍රයෙහි "ස්ථාන මාරු අපේක්ෂිත සේවා ස්ථාන" පිළිබඳ තොරතුරු ලබා ගැනීමේ එක් අරමුණක් වන්නේ සෑම අවස්ථාවකදී ම **අපේක්ෂිත සේවා ස්ථානවලටම ස්ථාන මාරු ලබා දීමට නොව, එසේ කළ නොහැකි අවස්ථා වලදී ස්ථාන මාරු අපේක්ෂිත ආයතන හෝ ප්‍රදේශය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට පමණක් බව** අවධාරණය කරනු ලැබේ. එබැවින් ස්ථාන මාරු අපේක්ෂිත සේවා ස්ථාන වල ප්‍රමුඛතාවය පිළිබඳව නිසි අවධානය යොමුකොට අයදුම්පතේ "ස්ථාන මාරු අපේක්ෂිත සේවා ස්ථාන" කොටස සම්පූර්ණ කිරීම ඉතා වැදගත් වේ.

**4.5.11.** **ආබාධිත තත්ත්වයේ හෝ බරපතල රෝගී තත්ත්වයන්ට යටත් වූ නිලධාරීන්, කලත්‍රයා ක්‍රියාත්විත ප්‍රදේශයන්හි/ ඉතා දුරබැහැර ප්‍රදේශයන්හි/ විදේශයන්හි සේවයේ නිරත නිලධාරීන් ස්ථාන මාරු ඉල්ලුම් කරන්නේ නම් එම නිලධාරීන් හට සුදුසු සේවා ස්ථාන ලබා දීමට හැකි සෑම උත්සාහයක් ම දැරිය යුතු ය.**

අනුමත අංකය ස්ථාන මාරු / 09
... ශරු ආචාර්යතුමා
... 2023 - 06 - 14 දින අනුමත කොට ඇති බව
... කරමු. පිටු 70
2023 . 06 . 19
ආණ්ඩුකාර ලේකම්

**4.5.12. ඉහත 4.5.2. යටතට නොගැනෙන, යම් නිලධරයෙකු එක් දෙපාර්තමේන්තුවක් හෝ ඒ යටතේ පවතින ආයතනවල උපරිම අවරුදු 10ක කාලයක් හා එක් අමාත්‍යාංශයක් හෝ ඒ යටතේ පවතින ආයතනවල උපරිම අවුරුදු 15ක් සේවය කර ඇත්නම්, එම නිලධාරියා වෙනත් අමාත්‍යාංශයක්, දෙපාර්තමේන්තුවක් හෝ ඒ යටතේ පවතින ආයතනයක් වෙත ස්ථාන මාරු කළ යුතු ය.**

**4.5.13. වෙනම වැය ශීර්ෂයක් ඇති / වෙනම ආයතන ප්‍රධානියෙකු සිටින ආයතන වෙන් වෙන් ආයතන ලෙස සලකා ක්‍රියා කළ යුතු වේ.**

**4.5.14.** සේවා කාලය ගණනය කිරීමේදී දෙපාර්තමේන්තුවක් / අමාත්‍යාංශයක් හෝ දිස්ත්‍රික්කයක් තුළ අඛණ්ඩව හෝ ඛණ්ඩව කළ සේවා කාලවල එකතුව මුළු සේවා කාලයක් ලෙස ගණන් ගනු ලැබේ.

**4.5.15.** කිසියම් දෙපාර්තමේන්තුවක් / අමාත්‍යාංශයක් යටතේ කුමන දිස්ත්‍රික්කයක සේවය කළද එම සේවා කාලය එම දෙපාර්තමේන්තුවේ / අමාත්‍යාංශයේ සේවා කාලය ලෙස ගණන් ගනු ලැබේ.

**4.5.16.** දිස්ත්‍රික්කයක් තුළ සේවා කාලය ගණන් ගැනීමේදී එම දිස්ත්‍රික්කය තුළ කුමන කාර්යාලයක සේවය කළද දිස්ත්‍රික් සේවා කාලය ලෙස ගණන් ගනු ලැබේ.

**4.5.17.** දෙපාර්තමේන්තුවක සේවය කළ කාලය ගණන් ගැනීමේදී, නිලධාරියෙකුගේ පාලන විෂය ඉක්මවා ගිය හේතුවක් මත (වැටුප් රහිත විදේශ නිවාඩු, අනුමත කරන ලද වැටුප් රහිත දේශීය නිවාඩු, විශේෂ අසනීප නිවාඩු වැනි) සේවයේ නොසිටි කාලය ගණන් ගනු නොලැබේ.

**4.5.18.** අමාත්‍යාංශ සංශෝධනය වීම හේතුවෙන් එක් අමාත්‍යාංශයක සිට වෙනත් අමාත්‍යාංශයකට යාමට සිදුවූ නිලධාරීන් සම්බන්ධයෙන් සේවා කාලය ගණනය කිරීමේදී පෙර සිටි අමාත්‍යාංශයේ සේවා කාලය ද මුළු සේවා කාලයට ගණන් ගනු ලැබේ.

**4.5.19.** භාර්යාව හා ස්වාමි පුරුෂයා යන දෙදෙනාම රාජ්‍ය සේවයේ නියුක්ත අය නම්, එම දෙදෙනාටම ඔවුන්ගේ ඉල්ලීම් අනුව එකම ප්‍රදේශයක සේවය කිරීමට ඉඩ ලබා දීමට මාරු මණ්ඩල සෑම උත්සාහයක්ම දැරිය යුතු ය.

**4.5.20.** වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් සලකා බලන නියමිත දිනට වයස අවුරුදු 55 ඉක්ම වූ නිලධාරීන් දිස්ත්‍රික්කයෙන් පිටතට මාරු නොකළ යුතු වුවත්, දිස්ත්‍රික්කය ඇතුළත ස්ථාන මාරු කිරීම් වලට යටත් වන්නේ ය. එහෙත් නිලධාරියාගේ ඉල්ලීම හෝ වෙනත් විශේෂිත කරුණු සැලකිල්ලට ගෙන දිස්ත්‍රික්කයෙන් පිටතට ස්ථාන මාරු කිරීමට සලකා බැලිය හැකිය.

අනුමත අංකය ස්ථාන මාරු / 09
2023.06.14 දින අනුමත කොට ඇති බව සහතික කරමු. පිටු 70 කි
2023 - 06 - 14

**4.5.21.** යම් සේවා ස්ථානයක සේවය කරන වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් සලකා බලන නියමිත දිනට වයස අවු. 57 ඉක්මවූ නිලධරයන් ද, ඉතා ප්‍රියමනාප සේවා ස්ථානයක සේවය කරන වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් සලකා බලන නියමිත දිනට වයස අවු. 59 ඉක්ම වූ නිලධරයන් ද ඔවුන්ගේ ඉල්ලීමක් නොවන කල්හි ස්ථාන මාරු නොකළ යුතු ය. (වාර්ෂික ස්ථාන මාරුවලට යටත් වන නිලධාරීන් ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කිරීම අනිවාර්යයෙන් සිදුකළ යුතු අතර, අයදුම්පතේ අදාළ කොටසේ ස්ථාන මාරු අපේක්ෂා කිරීම / නොකිරීම පිළිබඳ සඳහන් කළ යුතු ය.)

**4.5.22.** **ස්ථාන මාරුවීම් අයදුම් කිරීමේදී සහ අභියාචනා ඉදිරිපත් කිරීමේදී සලකා බලනු ලබන්නේ ඒ සඳහා සකස් කර හඳුන්වා දෙනු ලබන ආදර්ශ ආකෘති පත්‍රය අනුවම සකස් කළ අයදුම්පත් පිළිබඳව පමණි.**

**4.5.23.** **(අ) ස්ථාන මාරුවීම් නියෝග ලැබ සිටින නිලධාරියෙකු එම මාරුවීම ක්‍රියාත්මක වන දිනයෙන් පසු එම ආයතනයේ සේවයෙන් මුදා නොහැරීම රාජකාරී පැහැර හැරීමක් ලෙස සලකා ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVII වැනි පරිච්ඡේදයේ 8.1 හා 8.2 ප්‍රකාර ව විනයානුකූල ව කටයුතු කළ හැකිය.**

**(ආ) මෙම විධිවිධාන වලට පටහැනිව කටයුතු කරන ආයතන ප්‍රධානීන් සම්බන්ධයෙන් විනයානුකූල ව කටයුතු කිරීම පිණිස අදාළ බලධරයා වෙත වාර්තා කරනු ලැබේ.**

**4.5.24.** ප්‍රියමනාප නොවන්නා වූ සේවා ස්ථානයන්හි සේවය සඳහා නිලධාරීන් තෝරා ගැනීමේදී පාසල් යන දරුවන් ඇති විවාහක නිලධාරීන්ට වඩා අවිවාහක නිලධාරීන් ද, පාසල් යන දරුවන් නොමැති විවාහක නිලධාරීන් ද හැකි සෑම අවස්ථාවකදීම තෝරා ගැනීමට සැලකිලිමත් විය යුතු ය.

**4.5.25.** යම් නිලධාරියෙකු හට ස්ථාන මාරුවීමක් ලබා දී ඇති විටෙක එම නිලධාරියා විසින්ම එම ස්ථාන මාරුවීම අවලංගු කර ගැනීම සඳහා ඉතාම සාධාරණ හේතූන් මත ඉල්ලීමක් කර ඇති අවස්ථාවකදී එකී ස්ථාන මාරුව අවලංගු කර ඇති විටක එම නිලධාරියා ඊළඟ ඉදිරි වර්ෂයේ ස්ථාන මාරුවීම් සඳහා අනිවාර්යයෙන්ම යටත් වේ.

**4.5.26.** (අ) ස්ථාන මාරු වීම් ලැබේ යැයි අපේක්ෂා කරන නිලධාරීන්ගේ රාජකාරී කටයුතු කල් ඇතිව වෙනත් නිලධාරීන්ට පුහුණු කර වාර්ෂික ස්ථාන මාරුවීම් නියමිත දිනට ක්‍රියාත්මක කරවීමට දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ අමාත්‍යාංශ ලේකම්වරුන් කටයුතු කළ යුතු ය.

අනුමත අංකය ස්ථානමාරු / 09
2023.06.14 දින අනුමත කොට ඇති බව
සහතික කරමු.පිටු 70
2023.06.19
ආයතන ලේකම්

**(ආ) වාර්ෂික ස්ථාන මාරුවීම් වලට යටත් වීමට නියමිත නිලධාරීන්ට ප්‍රමුඛතාවය ලබා දෙමින්, ආයතනයේ සියලුම නිලධාරීන්ගේ රාජකාරී ආවරණය සඳහා සුදුසු අභ්‍යන්තර වැඩපිළිවෙළක් සකස් කිරීමට සියලුම ආයතන ප්‍රධානීන් වගබලාගත යුතු බව අවධාරණය කරන අතර,** ඒ සම්බන්ධයෙන් අධීක්ෂණ කටයුතු සිදු කිරීමට දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ අමාත්‍යාංශ ලේකම්වරුන් කටයුතු කළ යුතු ය.

**4.5.27.** වාර්ෂික ස්ථාන මාරුවලට යටත් වන නිලධාරියෙකු තම සේවා ස්ථානයේම රඳවා ගැනීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කරන අවස්ථාවේදී නිර්දේශ කිරීමට දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියෙකුට හැකියාව පවතී.

**4.5.28.** එසේ වුවද, ස්ථාන මාරුවීම් අපේක්ෂා කරන වෙනත් ආයතනයක නිලධාරියෙකු අදාළ ආයතනය වෙත ස්ථාන මාරු අයදුම් කර ඇත්නම්, අදාළ නිර්දේශය කුමක් වුවද ආයතනයේ සිටින ස්ථාන මාරු සඳහා යටත් වන නිලධාරීන් මාරු කිරීමට වාර්ෂික ස්ථාන මාරු කමිටුවලට හැකියාව පවතී.

**4.5.29.** (අ) වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛය නිකුත් කළ දින සිට එක් අමාත්‍යාංශයක් තුළ, අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ඇතුළත සුහද ස්ථාන මාරුවීම් ඇතුළු අනෙකුත් ස්ථාන මාරු වීම් සඳහා ද ඉල්ලුම්පත්‍ර භාර නොගත යුතු ය.

(ආ) එසේ වුවද, යම් හේතුවක් මත වාර්ෂික ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කරන දිනය දීර්ඝ වන්නේ නම්, වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබූ දින සිට දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ ආවරණ අනුමැතියට යටත්ව අදාළ වර්ෂයේ වාර්ෂික ස්ථාන මාරුවීම් වලට යටත් නොවන නිලධාරීන් සඳහා සුහද ස්ථාන මාරුවීම් ඇතුළු අනෙකුත් ස්ථාන මාරු වීම් ලබාදීමට කටයුතු කළ හැකිය.

**4.5.30.** සෑම නිලධාරියෙක් පිළිබඳවම නිවැරදි හා සම්පූර්ණ තොරතුරු සැපයීමට ආයතන ප්‍රධානීන්/ දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ අමාත්‍යාංශ ලේකම්වරුන් වගබලා ගත යුතුය. සාවද්‍ය, අසම්පූර්ණ තොරතුරු ඇති බව හෙළිවුවහොත් ඒ පිළිබඳව අදාළ ආයතන ප්‍රධානීන්/ දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ අමාත්‍යාංශ ලේකම්වරුන් හා එම ලැයිස්තු සකස් කළ හා හරි වැරදි බලන ලද නිලධාරීන් වගකීමට බැඳී සිටින අතර ඔවුන් විනයානුකූල කටයුතුවලට ද යටත් වේ.

**4.5.31.** නියමිත දිනට පසුව ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් හා අසම්පූර්ණ හා අසත්‍ය තොරතුරු ඇතුළත් අයදුම්පත් මාරු මණ්ඩල විසින් සලකා නොබලන අතර, එසේ **නියමිත දිනට ස්ථාන මාරු අයදුම්පත් හා තොරතුරු ඉදිරිපත් නොකරන අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කර නොමැති බවට සලකා ක්‍රියා කරනු ලැබේ.**

අනුමත අංකය ස්ථානමාරු /09
... ශත් ගරු ...
... 2023.06.14 දින අනුමත කොට ඇති බව
සභාවික තරමු.පිටු 70 කි
2023.06.19
ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

**4.5.32.** **වාර්ෂික ස්ථාන මාරු කමිටු මගින් අමාත්‍යාංශයෙන්/ දෙපාර්තමේන්තුවෙන් පිටතට ස්ථාන මාරුවීම් ලබා දී ඇති නිලධාරීන් අනුප්‍රාප්තිකයන් පැමිණෙන තෙක් රඳවා නොගෙන, නියමිත දින නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමට හැකිවන සේ ඔවුන් මුදා හැරීමට කටයුතු කළ යුතු ය.**

**4.5.33.** වාර්ෂික ස්ථාන මාරු නියෝගයක් ලැබූ සියලු ම නිලධාරීන්, නියමිත දිනයේ දී නව රාජකාරි ස්ථානය වෙත සේවය සඳහා වාර්තා කිරීමට බැඳී ඇත.

**4.5.34.** **වාර්ෂික ස්ථාන මාරු තීරණයන්හි දී ප්‍රසූත නිවාඩු මත වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක වීමට නියමිත දිනයේදී රාජකාරි භාර ගැනීමට අපොහොසත් වූ නිලධාරිනියන්ගේ වාර්ෂික ස්ථාන මාරුවීම් ප්‍රසූත නිවාඩු අවසන්ව පැමිණි දිනට සතියකට පසු ක්‍රියාත්මක කළ යුතු ය.**

**4.5.35.** වාර්ෂික ස්ථාන මාරු කමිටු වලින් තීරණ ගැනීමේදී මාරුවී යන සහ මාරුවී එන නිලධාරීන් දරන තනතුරුවල රාජකාරිවලට බාධාවක් නොවන පරිදි ක්‍රියා කළ යුතුය.

**4.5.36.** වාර්ෂික ස්ථාන මාරු නියෝගයක් මත නියමිත පරිදි පූර්ව සේවා ස්ථානයෙන් නිදහස් කරන ලද නමුත් නියමිත පරිදි නව සේවා ස්ථානය වෙත රාජකාරි සඳහා වාර්තා නොකර සිටින නිලධරයෙකු සිය කැමැත්තෙන් තනතුර අතහැර ගියා සේ සලකා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2022.12.14 දිනැති අංක 2310/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්ය පටිපාටික රීති සංග්‍රහයෙහි XV වැනි පරිච්ඡේදය ප්‍රකාර ව කටයුතු කිරීම අදාළ පරිදි නව දෙපාර්තමේන්තු ප්‍රධානීගේ හෝ නව ආයතන ප්‍රධානීගේ හෝ වගකීම වේ.

**4.5.37.** වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛය නිකුත් කිරීමෙන් පසුව, චක්‍රලේඛය නිකුත් කළ දිනට පෙර දාතම් යොදා අදාළ වර්ෂයේ වාර්ෂික ස්ථාන මාරුවීම් වලට යටත්වන නිලධාරීන් ස්ථාන මාරු කිරීමට කටයුතු නොකළ යුතු ය. තොරතුරු සහවා එලෙස ක්‍රියාකර ඇති බවට සනාථ වුවහොත් ඊට සම්බන්ධ සියළු නිලධාරීන් හට විනය ක්‍රියාමාර්ග ගනු ලැබේ.

**4.5.38.** වාර්ෂික ස්ථාන මාරු තීරණ නිකුත් කිරීමෙන් පසුව යම් හේතුවක් මත වාර්ෂික ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කරන දිනය දීර්ඝ වන විටකදී, ස්ථාන මාරු ගැලපීමට අදාළ නිලධාරීන් සියළු දෙනා ස්ථාන මාරුවීමට කැමැත්තෙන් පසුවේ නම්, ලිඛිත අනුමැතියක් යටතේ එම නිලධාරීන්ගේ ස්ථාන මාරුව ක්‍රියාත්මක කිරීමට අදාළ බලධාරීන් කටයුතු කළ යුතු ය.

අනුමත අංකය ස්ථානමාරු / 09
... ආත් ගරු ...
2023.06.14 දින අනුමත කොට ඇති බව
සහතික කරමු. පිටු 70 කි
2023.06.19
ආණ්ඩුකාර ලේකම්
... පළාත

**4.5.39.** **වාර්ෂික ස්ථාන මාරු තීරණ / සමාලෝචන තීරණ වලින් යම් නිලධාරියෙකුට අගතියක් සිදු වේ නම්, එම නිලධාරීන් පිළිබඳ දත්ත පද්ධතියක් සකස් කළ යුතු ය.**

**4.5.40.** **යම් වර්ෂයකදී වාර්ෂික ස්ථාන මාරු තීරණ / සමාලෝචන තීරණ වලින් යම් නිලධාරියෙකුට අගතියක් සිදු වේ නම් එම නිලධාරීන් හට ප්‍රමුඛතාවය ලබා දීම සිදුකළ යුතු ය.**

**4.5.A.** **ස්ථාන මාරු ලබාදීමේදී සැලකිල්ලට ගත යුතු අමතර කරුණු සම්බන්ධයෙන් අදාළ වර්ෂයේ වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛයේ නියමයන් පරිදි කටයුතු කළ යුතු ය.**

## 4.6. <u>වාර්ෂික ස්ථාන මාරු කාලසටහන</u>

**4.6.1.** **මාරු කමිටු හා අභියාචනා කමිටු පිහිටුවීම**

දකුණු පළාත් ප්‍රධාන ලේකම් විසින් තීරණය කරනු ලබන අදාළ වර්ෂයේ දිනක මාරු කමිටු හා අභියාචනා කමිටු පිහිටුවිය යුතු ය.

**4.6.2.** **වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛය නිකුත් කිරීම**

මාරු කමිටු හා අභියාචනා කමිටු පිහිටුවා මසක් ඉක්මවන්නට පෙර වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය සකස් කරගැනීම හා වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛය නිකුත් කිරීම සිදුකළ යුතු ය.

**4.6.3.** **වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් කැඳවීම**

වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛය නිකුත් කිරීමෙන් පසු සති හයක් තුළ නම් කරනු ලබන දිනයකට පෙර මාර්ගගතව (Online) ආකෘති අංක 01 මගින් දකුණු පළාත් ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු ය.

**4.6.4.** **අමාත්‍යාංශ ස්ථාන මාරු කමිටු / අභියාචනා කමිටු තීරණ නිකුත් කළ යුතු දිනය**

I. **අමාත්‍යාංශ මාරු කමිටු තීරණ නිකුත් කිරීම** - වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් ලැබී සති හතරක් ඉක්මවීමට පෙර, ඒ සම්බන්ධයෙන් දකුණු පළාත් ප්‍රධාන ලේකම් හා අදාළ ආයතන ප්‍රධානීන් දැනුවත් කළ යුතු ය.

II. **අමාත්‍යාංශ අභියාචනා කමිටු තීරණ නිකුත් කිරීම** - අමාත්‍යාංශ මාරු තීරණ නිකුත් කර සති හතරක් ඉක්මවීමට පෙර දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ වෙබ් අඩවියේ පළ කළ යුතු අතර, ඒ සම්බන්ධයෙන් දකුණු පළාත් සභාවේ අමාත්‍යාංශ ලේකම්වරු දැනුවත් කළ යුතු ය.

අනුමත අංකය ස්ථාන මාරු / 09
2023.06.14 දින අනුමත කොට ඇති බව
සහතික කරමු. පිටු 70 කි.
2023.06.19
ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

**4.6.5. වාර්ෂික ස්ථාන මාරු තීරණ නිකුත් කළ යුතු දිනය**

අමාත්‍යාංශ අභියාචනා තීරණ නිකුත් කර සති හයක් ඉක්මවීමට පෙර දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ වෙබ් අඩවියේ පළ කළ යුතු අතර, ඒ සම්බන්ධයෙන් දකුණු පළාත් සභාවේ අමාත්‍යාංශ ලේකම්වරු දැනුවත් කළ යුතු ය.

**4.6.6. වාර්ෂික ස්ථාන මාරු යෝජනා වලට අතෘප්තිමත් නිලධාරීන් සඳහා ප්‍රධාන ලේකම් වෙත අභියාචනා භාර ගැනීමේ අවසාන දිනය**

වාර්ෂික ස්ථාන මාරු තීරණ නිකුත් කර සති දෙකක් ඉක්මවීමට පෙර ආකෘති අංක 02 මගින් දකුණු පළාත් ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු ය.

**4.6.7. ප්‍රධාන ලේකම් අභියාචනා තීරණ දැනුම් දීම**

අභියාචනා භාර ගැනීමේ අවසන් දිනෙන් සති දෙකක් ඉක්මවීමට පෙර වාර්ෂික ස්ථාන මාරු වලට අදාළ අභියාචනා තීරණ නිකුත් කළ යුතු ය.

**4.6.8. වාර්ෂික ස්ථාන මාරු යෝජනා වලට අතෘප්තිමත් නිලධාරීන් සඳහා දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා භාර ගැනීමේ අවසාන දිනය**

ප්‍රධාන ලේකම් අභියාචනා තීරණ නිකුත් කර සති දෙකක් ඉක්මවීමට පෙර ආකෘති අංක 04 මගින් දකුණු පළාත් ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු ය.

**4.6.9. දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අභියාචනා තීරණ දැනුම් දීම**

අභියාචනා භාර ගැනීමේ අවසන් දිනෙන් සති දෙකක් ඉක්මවීමට පෙර වාර්ෂික ස්ථාන මාරු වලට අදාළ අභියාචනා තීරණ නිකුත් කළ යුතු ය.

**4.6.10. වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම**

ප්‍රධාන ලේකම් අභියාචනා මණ්ඩල තීරණ දැනුම් දීමෙන් සති අටත් නවයත් අතර කාලයක් තුළ වාර්ෂික ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කළ යුතු ය.

**4.6.A.** **ස්ථාන මාරු කාලසටහන සම්බන්ධයෙන් අදාළ වර්ෂයේ වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛයේ නියමයන් පරිදි කටයුතු කළ යුතු ය.**

**4.6.B.** **ඉහත 4.6.8. හා 4.6.9. හි සඳහන් කරුණු පිළිබඳ වැඩිදුර තොරතුරු 4.7. හි සඳහන් කර ඇත.**

**4.6.C.** **වාර්ෂික ස්ථාන මාරු අනුව සේවයෙන් මුදා හැරීමේදී 2022.12.14 දිනැති අංක 2310/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන කාර්ය පරිපාටික රීති 1 වැනි කාණ්ඩයේ 18 වන පරිශිෂ්ඨය ප්‍රකාරව සකස් කරන ලද ආකෘති අංක 03 අනුව මුදා හැරීමේ ලිපිය සකස් කළ යුතු ය.**

අනුමත අංකය ස්ථානමාරු / 09
ගරු ආචාර්යතුමා
2023. 06. 14 දින ...
සහතික කරමු.පිටු 70
2023. 06. 19

## 4.7. වාර්ෂික ස්ථාන මාරු නියෝග වලට විරුද්ධව දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අභියාචනා ඉදිරිපත් කිරීම

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2022.12.14 දිනැති අංක 2310/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්ය පරිපාටික රීති 1 වැනි කාණ්ඩයේ XVIII වැනි පරිච්ඡේදයේ 256 වැනි රීතියේ හා XIX වැනි පරිච්ඡේදයේ 279 රීතියේ විධිවිධාන අනුව ස්ථාන මාරු සමාලෝචන කමිටුවල නියෝගයන්ට එරෙහිව දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අභියාචනයක් බලය අභිනියෝජිත බලධරයා මගින් ඉදිරිපත් කළ හැකිය.

(අ) එම අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2022.12.14 දිනැති අංක 2310/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්ය පරිපාටික රීති 1 වැනි කාණ්ඩයේ 16 වන පරිශිෂ්ඨය ප්‍රකාරව සකස් කරන ලද ආකෘති අංක 04 මගින් ඉදිරිපත් කළ යුතු අතර, 256 රීතියේ විධිවිධාන අනුව ප්‍රධාන ලේකම් ස්ථාන මාරු අභියාචනා කමිටුවේ තීරණ නිකුත් කළ දිනයේ සිට දින 14ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු ය.

(ආ) දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කිරීම සඳහා යම් නිලධාරියෙකු විසින් ඉදිරිපත් කරන ලද අභියාචනයට අදාළ අනුප්‍රාප්තික නිලධාරීන් පිළිබඳ තොරතුරු හා එම අභියාචනය පිළිබඳ ස්වකීය නිරීක්ෂණ ඇතුළත් වාර්තාවක්, අදාළ ස්ථාන මාරු තීරණ නිකුත් කරන ලද ආයතනයේ ප්‍රධානී විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2022.12.14 දිනැති අංක 2310/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්ය පරිපාටික රීති 1 වැනි කාණ්ඩයේ 17 වන පරිශිෂ්ඨය ප්‍රකාරව සකස් කරන ලද ආකෘති අංක 05 මගින් ඉදිරිපත් කළ යුතු ය. (එනම්, අමාත්‍යාංශ වාර්ෂික ස්ථාන මාරු කමිටුව මගින් ලබා ගත් මාරු තීරණයක් නම් අදාළ අමාත්‍යාංශයේ ලේකම් විසින් ද, ප්‍රධාන ලේකම් වාර්ෂික ස්ථාන මාරු කමිටුව මගින් ලබා ගත් මාරු තීරණයක් නම් දකුණු පළාත් ප්‍රධාන ලේකම් විසින්ද ඉදිරිපත් කළ යුතුය.)

### 4.7.1. දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා සමාලෝචන මණ්ඩලය

I. ප්‍රධාන ලේකම් වාර්ෂික අභියාචනා මණ්ඩල තීරණ සම්බන්ධයෙන් තවදුරටත් අභියාචනා සිදුකරන නිලධාරීන්ගේ අභියාචනා සම්බන්ධයෙන් එම තීරණ තහවුරු කිරීම, සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම.

II. අමාත්‍යාංශ අභියාචනා මණ්ඩල තීරණ සම්බන්ධයෙන් තවදුරටත් අභියාචනා සිදුකරන නිලධාරීන්ගේ අභියාචනා සම්බන්ධයෙන් එම තීරණ තහවුරු කිරීම, සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම.

III. ප්‍රකාශයට පත් කරන ලද වාර්ෂික ස්ථාන මාරු මෙම චක්‍රලේඛයට අනනුකූල වන අවස්ථාවලදී ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම.

අනුමත අංකය ස්ථානමාරු / 09
2023. 06. 14 දින
සහතික කරමු. 70 කි.
2023. 06. 19.

IV. ස්ථාන මාරුවීම් අයදුම් කරන ලද දිනයෙන් පසුව නිලධාරීන්ට සිදු වූ හදිසි විපත් කරදර අසනීප වැනි සානුකම්පිත තත්වයන් සම්බන්ධයෙන් පිළිගත හැකි නිර්දේශ ඉදිරිපත් කර ඇත්නම් ඒවා පිළිබඳව කටයුතු කිරීම.

V. වාර්ෂික ස්ථාන මාරු අභියාචනා මණ්ඩල වෙත ඉදිරිපත් කරන ලද අභියාචනයක් සම්බන්ධයෙන් නොසලකා හැර ඇති බවට හැඟෙන්නේ නම් ඒවා පිළිබඳව කටයුතු කිරීම.

**සංයුතිය**

i. සභාපති - රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්
ii. ආණ්ඩුකාර ලේකම්
iii. සභා ලේකම්
iv. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)

**4.7.A.** වාර්ෂික ස්ථාන මාරු අභියාචනා භාර ගැනීම අවසන් කළ දිනයේ සිට දින 14ක් ඇතුළත අභියාචනා තීරණ ඉදිරිපත් කළ යුතු ය.

**4.7.B.** අභියාචනා ඉදිරිපත් කිරීමේදී සලකා බලනු ලබන්නේ ඒ සඳහා සකස් කර හඳුන්වා දෙනු ලබන ආදර්ශ ආකෘති පත්‍රය (ආකෘති අංක 04 හා 05) අනුවම සකස් කළ අයදුම්පත් පිළිබඳව පමණි.

**4.7.C.** ස්ථාන මාරුවීම් අයදුම් නොකළ නිලධාරීන් ස්ථාන මාරු කළ විට ඔවුන් විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචනා සම්බන්ධයෙන් සලකා නොබැලිය යුතු ය.

**4.7.D.** ප්‍රධාන ලේකම් වාර්ෂික ස්ථාන මාරු අභියාචනා මණ්ඩලය වෙත ඉදිරිපත් නොකරන ලද අභියාචනා ඇත්නම්, ඒ පිළිබඳ සලකා නොබැලිය යුතු ය.

ස්ථානමාරු / 09
ආණ්ඩුකාරතුමා
2023. 06. 14
70
2023. 06. 19
ආණ්ඩුකාර ලේකම්
පළාත

## 4.8. වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම පිළිබඳ පසුවිපරම් කටයුතු සිදුකිරීම

අදාළ වර්ෂයේ වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම පිළිබඳ පසුවිපරම් කටයුතු සිදුකිරීම පහත පරිදි සිදුකළ යුතු ය.

### 4.8.1. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව මගින්

I. මෙහිදී අදාළ වර්ෂයේ අමාත්‍යාංශ/ ප්‍රධාන ලේකම් වාර්ෂික ස්ථාන මාරු මණ්ඩල මගින් ලබා දී ඇති ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම පිළිබඳ පසුවිපරම් කටයුතු සිදුකිරීම කළ යුතු වේ.

II. වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කළ දින සිට දින 14කට පසු අදාළ පසුවිපරම් කටයුතු ආරම්භ කළ යුතු අතර, වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කළ දිනට මසකට පසු අදාළ වාර්තාව දකුණු පළාත් ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු ය.

### 4.8.2. වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම පිළිබඳ පසුවිපරම් කමිටුව මගින්

I. මෙහිදී අදාළ වර්ෂයේ අමාත්‍යාංශ/ ප්‍රධාන ලේකම් වාර්ෂික ස්ථාන මාරු මණ්ඩල මගින් ලබා දී ඇති ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම පිළිබඳ පසුවිපරම් කටයුතු සිදුකිරීම කළ යුතු වේ.

II. වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කළ දින සිට දින 14කට පසු අදාළ පසුවිපරම් කටයුතු ආරම්භ කළ යුතු අතර, වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කළ දිනට මසකට පසු අදාළ වාර්තාව දකුණු පළාත් ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු ය.

**සංයුතිය**

i. සභාපති - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)
ii. සහකාර ප්‍රධාන ලේකම් (පාලන)
iii. අමාත්‍යාංශ පහ (05) නියෝජනය වන පරිදි අදාළ අමාත්‍යාංශ ලේකම් විසින් නම් කළ ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියෙක්
iv. අදාළ වර්ෂයේ වාර්ෂික ස්ථාන මාරු මණ්ඩලයට සහභාගී වූ වෘත්තිය සංගම්වල එක් නියෝජිතයෙකු බැගින්

**4.8.A.** **වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම පිළිබඳ පසුවිපරම් කටයුතු සිදුකළ යුතු ආකාරය සම්බන්ධයෙන් අදාළ වර්ෂයේ වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛයේ නියමයන් පරිදි කටයුතු කළ යුතු ය.**

අනුමත අංකය ස්ථානමාරු / 09
දකුණු පළාත් ගරු ...
විසින් 2023. 06. 14 දින අනුමත කොට ඇති බව
සහතික කරමු. පිටු 70 කි.
2023. 06. 19

# 5. සේවා අවශ්‍යතා මත කරනු ලබන ස්ථාන මාරු

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2022.12.14 දිනැති අංක 2310/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්ය පරිපාටික රීති 1 වැනි කාණ්ඩයේ XVIII වැනි පරිච්ඡේදයේ 258 රීතිය මගින් දක්වා ඇති හේතු පදනම් කොටගෙන අවස්ථාවෝචිත පරිදි ස්ථාන මාරු සිදුකළ යුතු ය.

එනම්,

i. අත්‍යාවශ්‍ය හා ප්‍රමුඛ ලෙස හඳුනාගත් සේවා අවශ්‍යතා ඇති විටෙක
ii. යම් නිලධරයෙකුගේ සේවය ඔහුගේ වර්තමාන සේවා ස්ථානයට තවදුරටත් අවශ්‍ය නොවන විටෙක
iii. වෙනත් සේවා ස්ථානයක රාජකාරී අවශ්‍යතා සපුරාලීම සඳහා නිලධරයෙකු අවශ්‍ය වී ඇති විටක හෝ අදාළ නිලධරයා ම අවශ්‍ය වී ඇති විටෙක
iv. කිසියම් නිලධරයෙකු ඔහු සේවයේ නියුතුව සිටින සේවා ස්ථානයෙහි තවදුරටත් සේවයේ යෙදවීම පරිපාලනමය හේතු මත නුසුදුසු වන විටෙක

එහිදී පහත කරුණු කෙරෙහි අවධානය යොමු කළ යුතු ය.

**5.1.** සේවා අවශ්‍යතාවය මත යම් නිලධාරියෙකු ස්ථාන මාරු කිරීමට පෙර සත්‍ය වශයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2022.12.14 දිනැති අංක 2310/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්ය පරිපාටික රීති 1 වැනි කාණ්ඩයේ XVIII වැනි පරිච්ඡේදයේ 258 රීතිය මගින් දක්වා ඇති අවශ්‍යතාවයක් මතුව ඇති බවටත්, එම ස්ථාන මාරු කිරීම මීළඟ වාර්ෂික ස්ථාන මාරු කිරීම් සිදු කරන අවස්ථාව දක්වා ප්‍රමාද කිරීමට හැකියාවක් නොමැති බවටත් පත්වීම් බලධරයා හෝ බලය අභිනියෝජිත බලධරයා හෝ රාජකාරී පවරන ලද නිලධාරියා* පෞද්ගලිකවම සෑහීමකට පත්විය යුතු ය.

**5.2.** මතුව ඇති සේවා අවශ්‍යතාවයෙහි ස්වභාවය අනුව කෙටි කල් දීමක් සහිතව වුවද නිලධාරියෙකු ස්ථාන මාරු කිරීමට පත්වීම් බලධරයාට හෝ බලය අභිනියෝජිත බලධරයාට හෝ රාජකාරී පවරන ලද නිලධාරියාට* හැකියාව පවතී.

**5.3.** සේවා අවශ්‍යතාවය මත නිලධාරියෙකු ස්ථාන මාරු කිරීමට පාදක වූ සියළු කරුණු ඉතා පැහැදිලිව ලිපිගොනුවෙහි සටහන් කර තැබීමට පත්වීම් බලධරයා හෝ බලය අභිනියෝජිත බලධරයා හෝ රාජකාරී පවරන ලද නිලධාරියා* ක්‍රියා කළ යුතු ය.

අනුමත අංකය ස්ථානමාරු / 09
ගරු ...
2023. 06. 14 දින අනුමත කොට ඇති බව
සහතික කරමු. පිටු 70
2023. 06. 19
... කාර ලේකම්

**5.4.** පත්වීම් බලධරයා හෝ බලය අභිනියෝජිත බලධරයා හෝ රාජකාරී පවරන ලද නිලධාරියා* විසින් සේවා අවශ්‍යතාවය මත නිලධාරියෙකු ස්ථාන මාරු කිරීමට පාදක වූ කරුණු අදාළ නිලධාරියා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**5.A.** මෙහිදී "පත්වීම් බලධරයා" හා "බලය අභිනියෝජිත බලධරයා" යන්නෙන් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2019 හා 2019.06.01 දිනැතිව නිකුත් කරන ලද දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් ම ක්‍රියාත්මක කරනු ලබන සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට හෝ වෙනත් නිලධරයෙකුට අභිනියෝජනය කරන ලද බලතල පැවරීම ප්‍රකාර ව බලතල පවරන ලද යම් නිලධාරියෙකු වේ.

**5.B.** මෙහිදී රාජකාරි පවරන ලද නිලධාරියා* යන්නෙන් පහත පරිදි අදහස් කරනු ලැබේ.

**5.B.1.** අදාළ අමාත්‍යාංශ ලේකම් විසින් ස්ථාන මාරු සම්බන්ධයෙන් ලිඛිතව රාජකාරි පවරන ලද ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්/ සහකාර ලේකම්

**5.B.2.** දකුණු පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) / සහකාර ප්‍රධාන ලේකම් (පාලන)

අනුමත අංකය ස්ථානමාරු 1.09
දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා
විසින් 2023. 06. 14 දින අනුමත කොට ඇති බව
සහතික කරමු. පිටු 70 කි.
2023. 06. 19
ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

# 6. විනය හේතු මත කරනු ලබන ස්ථාන මාරු

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2022.12.14 දිනැති අංක 2310/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්ය පරිපාටික රීති 1 වැනි කාණ්ඩයේ XVIII වැනි පරිච්ඡේදය 263 රීතිය මගින් දක්වා ඇති අවස්ථාවන්හිදී කිසිදු කල් දීමක් නොකර වුවද නිලධාරියෙකු විනය හේතු මත ස්ථාන මාරු කිරීමට පත්වීම් බලධරයා හෝ බලය අභිනියෝජිත බලධරයා* විසින් කටයුතු කළ යුතුය.

එනම්,

i. අදාළ නිලධාරියාට එරෙහිව පවත්වන ලද විධිමත් විනය පරීක්ෂණයේ ප්‍රතිඵලයක් වශයෙන් දඬුවමක් ලෙස ස්ථාන මාරු කිරීමක් සහිත විනය නියෝගයක් නිකුත් කර ඇති විටෙක

ii. මූලික විමර්ශනයක් පැවැත්වීමෙන් පසු අනාවරණය වී ඇති කරුණු මත යම් නිලධාරියෙකුගේ වැඩ තහනම් නොකරන්නේ වුව ද, එම නිලධාරියා එම සේවා ස්ථානයෙහි තවදුරටත් සේවයෙහි යෙදවීම නොකළ යුතුව ඇති විටෙක

iii. මූලික විමර්ශනයක් ආරම්භ කිරීමට පෙරාතුව හෝ මූලික විමර්ශනයක් පවත්වාගෙන යන අතරතුර අනාවරණය වී ඇති කරුණු මත හෝ උද්ගතව ඇති තත්ත්වයන් මත හෝ කිසියම් නිලධාරියෙකු තවදුරටත් ඔහුගේ තනතුරෙහි හෝ වර්තමාන සේවා ස්ථානයෙහි සේවයෙහි යෙදවීම මූලික විමර්ශනයට බාධාවක් වන විටෙක

iv. යම් නිලධාරියෙකු / නිලධාරිනියක සම්බන්ධව පවතින පැමිණිල්ලක් පිළිබඳව පරීක්ෂා කිරීමට ප්‍රථම, එම නිලධාරියා හෝ නිලධාරිනිය එම සේවා ස්ථානයේ තැබීම එම පරීක්ෂණයට බාධාවක් වේ යැයි පෙනී යන විට, පරීක්ෂණ කටයුතු අවසන් වනතෙක් හෝ පරීක්ෂණ මණ්ඩලය / විනය බලධරයා තීරණය කරනු ලබන සුදුසු කාලයක් සඳහා නිලධාරියෙකු / නිලධාරිනියක තාවකාලිකව සේවා ස්ථානයෙන් බැහැරට අනුයුක්ත කිරීමට පත්වීම් බලධරයාට / ප්‍රධානියාට හිමිකම ඇත.

ඒ අනුව, පත්වීම් බලධරයා හෝ බලය අභිනියෝජිත බලධරයා* විසින් විනය හේතු මත නිලධාරියෙකු ස්ථාන මාරු කිරීමට පාදක වූ කරුණු අදාළ නිලධාරියා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

අනුමත අංකය ස්ථානමාරු / 09
2023.06.14 දින අනුමත කොට ඇත
70
2023.06.14

**6.A.** මෙහිදී බලය අභිනියෝජිත බලධරයා* යන්නෙන් අදහස් කරනුයේ දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2019 හා 2019.06.01 දිනැතිව නිකුත් කරන ලද දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් ම ක්‍රියාත්මක කරනු ලබන සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට හෝ වෙනත් නිලධරයෙකුට අභිනියෝජනය කරන ලද බලතල පැවරීම ප්‍රකාර ව දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් බලය පවරන ලද යම් නිලධාරියෙකු වේ.

## 6.1. විනය හේතු මත හා නැවත සේවයේ පිහිටුවන ලද නිලධාරීන් ස්ථාන මාරු කිරීම

විනය හේතු මත හා නැවත සේවයේ පිහිටුවන ලද නිලධාරීන් සම්බන්ධයෙන් කටයුතු කිරීම දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ දකුණු පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) / සහකාර ප්‍රධාන ලේකම් (පිරිස්) විසින් සිදුකරනු ලබන අතර, එහිදී විනය හේතු මත හා නැවත සේවයේ පිහිටුවන ලද යම් නිලධාරියෙකු අදාළ සේවා ස්ථානයේ තවදුරටත් සේවය කිරීම සුදුසු නොවන බවට නිගමනය කර ඇති විටෙක එකී නිලධාරියා ස්ථාන මාරු කිරීමට දකුණු පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) / සහකාර ප්‍රධාන ලේකම් (පාලන) විසින් කටයුතු කළ යුතු ය.

ස්ථානමාරු / 09
ආණ්ඩුකාරතුමා
2023.06.14
70
2023.06.19

# 7. රජයේ නිලධාරීන්ගේ ඉල්ලීම මත කරනු ලබන වාර්ෂික නොවන ස්ථාන මාරු

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2022.12.14 දිනැති අංක 2310/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්ය පරිපාටික රීති 1 වැනි කාණ්ඩයේ XVIII වැනි පරිච්ඡේදයේ 223 රීතියේ විධිවිධාන අනුව අවස්ථාවෝචිත පරිදි ස්ථාන මාරු සිදුකළ යුතු ය.

එනම්,

i. වෛද්‍ය හේතු
ii. අනපේක්ෂිත සිදුවීම් නිසා මුහුණු දීමට සිදුවන පෞද්ගලික ගැටලු මත
iii. නිලධාරියාට අදාළ සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීම් පටිපාටිවල සඳහන් කර ඇති අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීම සඳහා කරනු ලබන ඉල්ලීම්
iv. නිලධාරියාගේ වෙනත් පෞද්ගලික අපහසුතා වලට සහන සැලසීම

## 7.1. සාමාන්‍ය ස්ථාන මාරු

**7.1.1.** 2017.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි දකුණු පළාත් සභාවේ නිලධාරීන්ගේ ස්ථාන මාරු ඉල්ලීම් සම්බන්ධයෙන් කටයුතු කිරීමට ආකෘති අංක **CSS/03/06/ FO-3** මගින් නව අයදුම්පතක් (ආකෘති අංක 06) හඳුන්වා දී ඇත.

**7.1.2.** යම් නිලධාරියෙකු හට වාර්ෂික ස්ථාන මාරුවීම් වලට අදාළ කාලසීමාවන්ට පෙර තම සේවා ස්ථානයෙන් පරිබාහිර වෙනත් සේවා ස්ථානයකට ස්ථාන මාරුවීමට අවශ්‍ය වන්නේ නම්, ආකෘති අංක **CSS/03/06/FO-3** මගින් ස්ථාන මාරු ඉල්ලීම ඉදිරිපත් කළ යුතු ය.

**7.1.3.** ආකෘති අංක **CSS/03/06/FO-3** මගින් ඉදිරිපත් කරන ස්ථාන මාරු ඉල්ලීම ආයතන ප්‍රධානී, දෙපාර්තමේන්තු ප්‍රධානී, අමාත්‍යාංශ ලේකම් ආදී නිසි නිල මගින් දකුණු පළාත් ප්‍රධාන ලේකම් වෙත යොමු කළ යුතු ය.

**7.1.4.** ස්ථාන මාරු අයදුම්පත් ප්‍රධාන ලේකම් කාර්යාලයීය ස්ථාන මාරු දත්ත පද්ධතියට ඇතුළත් කළ පසු අදාළ අයදුම්පත් අංකය ස්ථාන මාරුව ඉල්ලීම් සිදුකළ නිලධාරියා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**7.1.5.** ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී මාර්ගගත ක්‍රමය ඔස්සේ (Online) යොමු කරන්නේ නම් ඒ සම්බන්ධයෙන් ලබා දී ඇති උපදෙස් ප්‍රකාර ව කටයුතු කළ යුතු අතර, ඉහත 7.1.1. සිට 7.1.4. දක්වා කරුණු අදාළ නොවේ.

අනුමත අංකය: ස්ථානමාරු /09
දකුණු පළාත් ගරු: ආර්ථිකා රතුමා
විසින් 2023. 06. 14 දින අනුමත කොට ඇති ...
සහතික කරමු. පිටු 70 කි.
2023. 06. 19

**7.1.6.** නිවැරදිව සම්පූර්ණ කරන ලද හා නිසි නිල මගින් ඉදිරිපත් කරන ලද අඩුපාඩු රහිත ස්ථාන මාරු අයදුම්පත් ප්‍රධාන ලේකම් කාර්යාලයීය ස්ථාන මාරු දත්ත පද්ධතියට ඇතුළත් කළ යුතු ය.

**7.1.7.** "අනුප්‍රාප්තිකයෙකු සහිතව/ අනුප්‍රාප්තිකයෙකු රහිතව/ අනුප්‍රාප්තිකයෙකු පසුව ලබාදීමේ පදනම මත/ නව බඳවා ගැනීමකදී අනුප්‍රාප්තිකයෙකු ලබාදීම" යන නිර්දේශ මත පුරප්පාඩු පවතින සේවා ස්ථාන, නිලධාරීන්ගේ ඉල්ලීම් අනුව අපේක්ෂිත සේවා ස්ථාන හා නිලධාරීන්ගේ වර්තමාන සේවා ස්ථාන සමඟ ගැලපීම් සිදුකිරීම මගින් ස්ථාන මාරු නියෝග ලබා දෙනු ලැබේ.

**7.1.8.** ඉහත 7.1.7. හි නිර්දේශය "අනුප්‍රාප්තිකයෙකු රහිතව" ලෙස නිර්දේශ කරන කල්හි එම නිලධාරියා ස්ථාන මාරු කිරීමෙන් ඇතිවන පුරප්පාඩුවට අනුප්‍රාප්තිකයෙකු අවශ්‍ය නොවන බවට අදාළ ආයතන ප්‍රධානීන් වගබලාගත යුතු ය.

**7.1.9.** ප්‍රධාන ලේකම් කාර්යාලයීය ස්ථාන මාරු දත්ත පද්ධතියට ඇතුළත් කරන ස්ථාන මාරු ඉල්ලීම් සඳහා එම අවස්ථාවේදී ස්ථාන මාරුවක් ගැලපීම් කළ නොහැකි නම්, ඉදිරියේදී සලකා බැලීම සඳහා ස්ථාන මාරු දත්ත පද්ධතියේ තවදුරටත් රඳවා ගත යුතු ය.

**7.1.10.** **ස්ථාන මාරු ඉල්ලීම අවලංගු කිරීමට හෝ ස්ථාන මාරු අයදුම්පත්වල සඳහන් කරුණු වෙනස් කිරීමට අවශ්‍ය වන්නේ නම් ආයතන ප්‍රධානීන්ගේ නිර්දේශ සහිතව දකුණු පළාත් ප්‍රධාන ලේකම් වෙත එවීමට කටයුතු කළ යුතු ය.**

**7.1.11.** කිසියම් අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක හෝ සේවා ස්ථානයක සේවය කරන නිලධාරියෙකුගේ ස්ථාන මාරු අයදුම්පතක් ප්‍රධාන ලේකම් කාර්යාලයීය ස්ථාන මාරු දත්ත පද්ධතියට ඇතුළත් කළ පසු එම නිලධාරියා හට අභ්‍යන්තර ස්ථාන මාරුවීම් ලබා දෙන්නේ නම්, ප්‍රධාන ලේකම් කාර්යාලයීය ස්ථාන මාරු දත්ත පද්ධතියට ඇතුළත් කිරීමේදී ලබාදෙන ලද අයදුම්පත් අංකය සඳහන් කරන ලද අදාළ අභ්‍යන්තර ස්ථාන මාරු ලිපියේ පිටපතක් දකුණු පළාත් ප්‍රධාන ලේකම් වෙත යොමු කළ යුතු ය.

**7.1.12.** **ප්‍රධාන ලේකම් කාර්යාලයීය ස්ථාන මාරු දත්ත පද්ධතියේ ලියාපදිංචි වී ඇති නිලධාරියෙකු හට 7.1.11. යටතේ දක්වා ඇති පරිදි පූර්ව දැනුම්දීමකින් තොරව අභ්‍යන්තර ස්ථාන මාරු වීම් ලබා දී ඇති අවස්ථාවක, දකුණු පළාත් ප්‍රධාන ලේකම්/ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)/ සහකාර ප්‍රධාන ලේකම් (පාලන) විසින් ස්ථාන මාරු නියෝගයක් ලබා දී ඇත්නම් අදාළ අභ්‍යන්තර ස්ථාන මාරුව අවලංගු කිරීමට සිදුවන බව අවධාරණය කෙරේ.**

අනුමත අංකය ස්ථානමාරු /09
ආත්අනාරකුණ
2023. 06. 14 දින අනුමත කොට ඇති බව
සනාතික කරමු.පිටු 70 කි.
2023. 06. 19

7.1.13. ස්ථාන මාරු සිදුකරන නිලධාරීන් එකම සේවයක හා ශ්‍රේණියක හෝ සමාන තනතුරු වල හෝ සේවයෙහි නියුක්ත විය යුතු ය.

**7.1.14. ස්ථාන මාරු වී ගිය යම් නිලධාරියෙකු වසරක් තුළ ආසන්නතම පූර්ව සේවා ස්ථානය වෙත නැවත ස්ථාන මාරු අපේක්ෂා කරන්නේ නම්, අවම වශයෙන් වසරකට වැඩි කාලයක් වර්තමාන සේවා ස්ථානයේ සේවය කළ යුතු වේ. එසේ වර්තමාන සේවා කාලයේ වසරකට අඩු කාලයක් සේවය කර ආසන්නතම පූර්ව සේවා ස්ථානයට ස්ථාන මාරු වන්නේ නම්, වර්තමාන සේවා ස්ථානයේ සිටි සේවා කාලය සේවා බණ්ඩනයක් සේ නොසැලකිය යුතු ය.**

(උදා:- යම් නිලධාරියෙකු A කාර්යාලයේ වසර පහක් සේවය කර B කාර්යාලයට ස්ථාන මාරු වී, මාස තුනක් B කාර්යාලයේ සේවය කිරීමෙන් පසුව නැවත A කාර්යාලයට ස්ථාන මාරු වන්නේ නම්, එම නිලධාරියා විසින් A කාර්යාලයේ වසර පහක් හා මාස තුනක කාලයක් සේවය කළා සේ සලකා ක්‍රියා කළ යුතු වේ.)

7.1.15. නිලධාරියෙකුගේ ඉල්ලීමක් අනුව කරන ලද මාරුවීමක් අවලංගු කරන ලෙස හෝ කල් දමන ලෙසට පසුව අභියාචනය කිරීමට එම නිලධාරියාට හෝ ඒ පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීමට දෙපාර්තමේන්තු ප්‍රධානියාට හිමිකමක් නොමැත.

7.1.16. පත්වීම් බලධරයා හෝ බලය අභිනියෝජිත බලධරයා හෝ රාජකාරි පවරන ලද නිලධාරියා* විසින් නිලධාරියෙකු ස්ථාන මාරු කිරීමට පාදක වූ කරුණු අදාළ නිලධාරියා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

7.1.17. අසම්පූර්ණ, අසත්‍ය තොරතුරු ඇතුළත් අයදුම්පත් හා නිසි නිල මඟින් ඉදිරිපත් නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7.1.A. මෙහිදී "පත්වීම් බලධරයා" හා "බලය අභිනියෝජිත බලධරයා" යන්නෙන් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2019 හා 2019.06.01 දිනැතිව නිකුත් කරන ලද දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් ම ක්‍රියාත්මක කරනු ලබන සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට හෝ වෙනත් නිලධරයෙකුට අභිනියෝජනය කරන ලද බලතල පැවරීම ප්‍රකාර ව බලතල පවරන ලද යම් නිලධාරියෙකු වේ.**

**7.1. B. මෙහිදී රාජකාරි පවරන ලද නිලධාරියා* යන්නෙන් පහත පරිදි අදහස් කරනු ලැබේ.**

**7.1.B.1. අදාළ අමාත්‍යාංශ ලේකම් විසින් ස්ථාන මාරු සම්බන්ධයෙන් ලිඛිතව රාජකාරි පවරන ලද ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්/ සහකාර ලේකම්**

**7.1.B.2. දකුණු පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) / සහකාර ප්‍රධාන ලේකම් (පාලන)**

අනුමත අංකය ස්ථානමාරු / 09
දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා
විසින් 2023.06.14 දින අනුමත කොට ඇති බව
සහතික කරමු. පිටු 70
2023.06.14

**7.2. සුභද ස්ථාන මාරු**

**7.2.1.** ආකෘති අංක **CSS/03/06/FO-3** (ආකෘති අංක 06) මගින් හෝ **මාර්ගගත ක්‍රමය ඔස්සේ (Online)** ඉදිරිපත් කරන ස්ථාන මාරු අයදුම්පතේ අදාළ කොටසේ "සුභද ස්ථාන මාරු ඉල්ලුම් කර ඇති නිලධාරියා සමඟ සිදුකිරීම" යන නිර්දේශය සහිතව ආයතන ප්‍රධානී, දෙපාර්තමේන්තු ප්‍රධානී, අමාත්‍යාංශ ලේකම් ආදී නිසි නිල මගින් දකුණු පළාත් ප්‍රධාන ලේකම් වෙත යොමු කළ යුතු ය.

**7.2.2.** සුභද ස්ථාන මාරුව අපේක්ෂිත නිලධාරීන්ගේ කැමැත්ත ප්‍රකාශිත ලිපි ස්ථාන මාරු අයදුම්පත්‍ර සමඟ ඉදිරිපත් කළ යුතු ය.

**7.2.3.** 7.1.7. හා 7.1.8. හැර 7.1. යටතේ දක්වා ඇති සියළු කොන්දේසි මේ සඳහා ද අදාළ වේ.

**7.2.4.** පත්වීම් බලධරයා හෝ බලය අභිනියෝජිත බලධරයා හෝ රාජකාරී පවරන ලද නිලධාරියා* විසින් නිලධාරියෙකු ස්ථාන මාරු කිරීමට පාදක වූ කරුණු අදාළ නිලධාරියා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**7.2.A.** මෙහිදී "පත්වීම් බලධරයා" හා "බලය අභිනියෝජිත බලධරයා" යන්නෙන් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2019 හා 2019.06.01 දිනැතිව නිකුත් කරන ලද දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් ම ක්‍රියාත්මක කරනු ලබන සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට හෝ වෙනත් නිලධරයෙකුට අභිනියෝජනය කරන ලද බලතල පැවරීම ප්‍රකාර ව බලතල පවරන ලද යම් නිලධාරියෙකු වේ.

**7.2. B.** මෙහිදී රාජකාරී පවරන ලද නිලධාරියා* යන්නෙන් පහත පරිදි අදහස් කරනු ලැබේ.

**7.2.B.1.** අදාළ අමාත්‍යාංශ ලේකම් විසින් ස්ථාන මාරු සම්බන්ධයෙන් ලිඛිතව රාජකාරී පවරන ලද ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්/ සහකාර ලේකම්

**7.2.B.2.** දකුණු පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)/ සහකාර ප්‍රධාන ලේකම් (පාලන)

අනුමත අංකය
දකුණු පළාත් ගරු ...
විසින් 2023. 06. 14
දින අනුමත කොට ඇති බව
සහතික කරමු. පිටු 70
2023. 06. 19
ආණ්ඩුකාර ලේකම්

## 7.3. ඉතා ප්‍රියමනාප සේවා ස්ථාන සඳහා නිලධාරීන් ස්ථාන මාරු කිරීම

**7.3.1.** ඉතා ප්‍රියමනාප සේවා ස්ථානයක යම් පුරප්පාඩුවක් ඇතිවුවහොත් හෝ නව තනතුරු ඇති කිරීමේදී හෝ එවැනි ආයතනයක යම් නිලධාරියෙකු ස්ථාන මාරුවක් අපේක්ෂා කර අයදුම්පතක් යොමු කර ඇත්නම්, ඒ සඳහා යම් නිලධාරියෙකු ස්ථාන මාරු කිරීමේදී හෝ අදාළ පුරප්පාඩු සම්පූර්ණ කිරීමේදී ඒ වන විට එම ඉතා ප්‍රියමනාප ස්ථාන සඳහා ස්ථාන මාරු අයදුම්පත් යොමු කර ඇති නිලධාරීන් සඳහා ප්‍රමුඛතාවය ලබා දිය යුතු වේ.

**7.3.2.** ඉහත 7.3.1. පරිදි ක්‍රියාකිරීම සඳහා දකුණු පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන), සහකාර ප්‍රධාන ලේකම් (පාලන) හා අදාළ ඉතා ප්‍රියමනාප සේවා ස්ථානයේ පුරප්පාඩු පිරවීමේදී අනුගමනය කිරීම පිණිස හඳුන්වා දී ඇති ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද පරිපාටිය අනුව සිදුකළ යුතු ය.

**7.3.3.** ඉතා ප්‍රියමනාප සේවා ස්ථාන වෙත සුහද ස්ථාන මාරු නිර්දේශය යටතේ නිලධාරීන් ස්ථාන මාරු නොකළ යුතු ය.

**7.3.4.** නිලධාරියෙකුට සිය සේවා කාලය තුළ එක් අවස්ථාවකදී පමණක් ඉතා ප්‍රියමනාප සේවා ස්ථානයක සේවය කළ හැකිය.

**7.3.5.** භාර්යාව හා ස්වාමි පුරුෂයා යන දෙදෙනාම රාජ්‍ය සේවයේ යෙදෙන විට ඉහත ඉතා ප්‍රියමනාප සේවා ස්ථානයක් සඳහා අවස්ථාව දෙනු ලබන්නේ දෙදෙනාගෙන්ම එක් අයෙකු සඳහා මුළු සේවා කාලය සඳහාම එක් අවස්ථාවක් පමණක් වේ.

අනුමත අංකය ස්ථානමාරු / 09
දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා
විසින් 2023. 06. 14 දින අනුමත කොට ඇති බව
සහතික කරමු. පිටු 70 කි.
2023. 06. 19
ආණ්ඩුකාර ලේකම්

## 7.4. අන්තර් පළාත් හෝ මධ්‍යම රජයේ සේවයෙන් දකුණු පළාතට ස්ථාන මාරු වී පැමිණෙන නිලධාරීන් සම්බන්ධයෙන් ක්‍රියා කිරීම

අන්තර් පළාත් හෝ මධ්‍යම රජයේ සේවයෙන් දකුණු පළාතට නිලධාරීන් ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් අන්තර් පළාත් හා මධ්‍යම රජය සමඟ කටයුතු කිරීම දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හා පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) / සහකාර ප්‍රධාන ලේකම් (පිරිස්) විසින් සිදුකරනු ලබන අතර, දකුණු පළාතට ස්ථාන මාරු වී පැමිණෙන නිලධාරීන් සුදුසු ආයතන වෙත ස්ථාන මාරු කිරීමට දකුණු පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) / සහකාර ප්‍රධාන ලේකම් (පාලන) විසින් කටයුතු කළ යුතු ය.

## 7.5. තාවකාලිකව අනුයුක්ත කිරීම

ප්‍රධාන ලේකම් කාර්යාලයීය ස්ථාන මාරු දත්ත පද්ධතියට ඇතුළත් කරන ස්ථාන මාරු ඉල්ලීම් සඳහා එම අවස්ථාවේදී ස්ථාන මාරුවක් ගැලපීම් කළ නොහැකි විටක, යම් නිලධාරියෙකු වෛද්‍ය හේතු මත, ආබාධිත දරුවන්, දීර්ඝ කාලීනව අසනීප මත එක්තැන්ව සිටින කලත්‍රයන් සිටින නිලධාරීන්ට මුහුණදීමට සිදුවන විසඳාගත නොහැකි ගැටළු වලදී පිළිගත හැකි කරුණු සහිතව තම දෙපාර්තමේන්තු ප්‍රධානී නිර්දේශයන් ද සමඟ ඉදිරිපත් කරන ඉල්ලීම් පිළිබඳව සැලකිල්ලට ගෙන **මාස 06කට නොවැඩි කාලයක් සඳහා** නිලධාරියා විසින් ඉල්ලුම් කරන හෝ පත්වීම් බලධරයා හෝ බලය අභිනියෝජිත බලධරයා හෝ රාජකාරී පවරන ලද නිලධාරියා*ගේ අභිමතය පරිදි සුදුසු සේවා ස්ථානයක් වෙත තාවකාලිකව අනුයුක්ත කළ හැකිය.

එහිදී පහත කරුණු කෙරෙහි අවධානය යොමු කළ යුතු ය.

**7.5.1.** යම් නිලධාරියෙකු සම්බන්ධයෙන් සේවා අවශ්‍යතාවය මත ආයතන ප්‍රධානී නිර්දේශ සැලකිල්ලට ගෙන **මාස 06කට නොවැඩි කාලයක් සඳහා** තාවකාලිකව අනුයුක්ත කළ හැකිය.

**7.5.2.** යම් සේවා ස්ථානයක් වෙත තාවකාලිකව අනුයුක්ත කළ නිලධාරියෙකු තාවකාලික අනුයුක්තිය දීර්ඝ කරන ලෙස පිළිගත හැකි කරුණු සහිතව තම දෙපාර්තමේන්තු ප්‍රධානී නිර්දේශයන් ද සමඟ ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති විටක,

අනුමත අංකය ස්ථානමාරු / 09
දකුණු පළාත් සභා ගරු ආණ්ඩුකාර තුමා
විසින් 2023.06.14 දින අනුමත කොට ඇති බව
සහතික කරමු. පිටු 70 කි.
2023.06.19
ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

එම ඉල්ලීම සම්බන්ධයෙන් පත්වීම් බලධරයා හෝ බලය අභිනියෝජිත බලධරයා හෝ රාජකාරි පවරන ලද නිලධාරියා* විසින් තම අභිමතය පරිදි කටයුතු කළ යුතුය.

7.5.3. තාවකාලිකව අනුයුක්ත කරන නිලධාරියෙකු එම තාවකාලික අනුයුක්තිය අවසන් වූ වහාම තම නිත්‍ය සේවා ස්ථානයට වාර්තා කළ යුතු ය.

7.5.4. පත්වීම් බලධරයා හෝ බලය අභිනියෝජිත බලධරයා හෝ රාජකාරි පවරන ලද නිලධාරියා* විසින් නිලධාරියෙකු තාවකාලිකව අනුයුක්ත කිරීමට පාදක වූ කරුණු අදාළ නිලධාරියා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

7.4. A . මෙහිදී "පත්වීම් බලධරයා" හා "බලය අභිනියෝජිත බලධරයා" යන්නෙන් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2019 හා 2019.06.01 දිනැතිව නිකුත් කරන ලද දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් ම ක්‍රියාත්මක කරනු ලබන සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට හෝ වෙනත් නිලධරයෙකුට අභිනියෝජනය කරන ලද බලකල පැවරීම ප්‍රකාර ව බලතල පවරන ලද යම් නිලධාරියෙකු වේ.

7.4. B. මෙහිදී රාජකාරි පවරන ලද නිලධාරියා* යන්නෙන් පහත පරිදි අදහස් කරනු ලැබේ.

7.4.B.1. අදාළ අමාත්‍යාංශ ලේකම් විසින් ස්ථාන මාරු සම්බන්ධයෙන් ලිඛිතව රාජකාරි පවරන ලද ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්/ සහකාර ලේකම්

7.4.B.2. දකුණු පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)/ සහකාර ප්‍රධාන ලේකම් (පාලන)

අනුමත අංකය ස්ථානමාරු / 09
දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා
විසින් 2023. 06. 14 දින අනුමත කොට ඇති බව
සහතික කරමු. පිටු 70 කි.
2023. 06. 15

# 8. සේවා අවශ්‍යතාවය මත, විනය හේතු මත හා වාර්ෂික නොවන ස්ථාන මාරු නියෝග වලට විරුද්ධව අභියාචනා ඉදිරිපත් කිරීම

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2022.12.14 දිනැති අංක 2310/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්ය පරිපාටික රීති 1 වැනි කාණ්ඩයේ XVIII වැනි පරිච්ඡේදය 266 රීතියේ හා XIX වැනි පරිච්ඡේදයේ 280 රීතියේ විධිවිධාන අනුව සේවා අවශ්‍යතාවය මත, විනය හේතු මත හා වාර්ෂික නොවන ස්ථාන මාරු නියෝගයන්ට එරෙහිව අභියාචනයක් බලය අභිනියෝජිත බලධරයා මගින් ඉදිරිපත් කළ හැකිය.

## 8.1. දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත අභියාචනා ඉදිරිපත් කිරීම

(අ) එම අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2022.12.14 දිනැති අංක 2310/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්ය පරිපාටික රීති 1 වැනි කාණ්ඩයේ 19 වන පරිශිෂ්ඨය ප්‍රකාරව සකස් කරන ලද ආකෘති අංක 07 අනුව, ස්ථාන මාරු නියෝගය නිලධාරියා වෙත ලද දිනයේ සිට දින 14ක් ඇතුළත අදාළ අමාත්‍යාංශ ලේකම් මගින් දකුණු පළාත් ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු ය.

(ආ) එම අභියාචනා දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත ලද දිනයේ සිට දින 14ක් ඇතුළත අභියාචනා තීරණ නිකුත් කළ යුතු ය.

## 8.2. දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කිරීම

(අ) යම් නිලධාරියෙකු තම අභියාචනය සම්බන්ධයෙන් දකුණු පළාත් ප්‍රධාන ලේකම්වරයා විසින් ලබාදුන් තීරණය සම්බන්ධයෙන් සෑහීමකට පත් නොවන්නේ නම් පමණක්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2022.12.14 දිනැති අංක 2310/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්ය පරිපාටික රීති 1 වැනි කාණ්ඩයේ XIX වැනි පරිච්ඡේදයේ 280 රීතියේ විධිවිධාන අනුව ස්ථාන මාරු නියෝගයට එරෙහිව දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය.

(ආ) එම අභියාචනා කාර්ය පරිපාටික 1 වැනි කාණ්ඩයේ 19 වන පරිශිෂ්ඨය ප්‍රකාරව සකස් කරන ලද ආකෘති අංක 08 මගින් ඉදිරිපත් කළ යුතු අතර, එම ස්ථාන මාරු නියෝගය සම්බන්ධයෙන් දකුණු පළාත් ප්‍රධාන ලේකම් විසින් අභියාචනා තීරණ නිකුත් කළ

අනුමත අංකය ස්ථානමාරු /09
... ගරු ... 
2023.06.19 දින අනුමත කොට ඇති ...
සභාජීත කරමු.පිටු 70
2023.06.19
... ලේකම්
දකුණු පළාත

දිනයේ සිට දින 14ක් ඇතුළත අදාළ අමාත්‍යාංශ ලේකම් හා දකුණු පළාත් ප්‍රධාන ලේකම් මගින් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

(ඇ) එම අභියාචනා දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ලද දිනයේ සිට දින 14ක් ඇතුළත අභියාචනා තීරණ නිකුත් කළ යුතු ය.

**8.A.** **අභියාචනා ඉදිරිපත් කිරීමේදී සලකා බලනු ලබන්නේ ඒ සඳහා සකස් කර හඳුන්වා දෙනු ලබන ආදර්ශ ආකෘති පත්‍රය (ආකෘති අංක 07 හා 08) අනුවම සකස් කළ අයදුම්පත් පිළිබඳව පමණි.**

**8.B.** **දකුණු පළාත් ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් නොකරන ලද අභියාචනා දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත්නම්, ඒ පිළිබඳ සලකා නොබැලිය යුතු ය.**

**8.C.** **දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණයක් සම්බන්ධයෙන් අතෘප්තියට පත් යම් නිලධාරියෙකු ඇත්නම්, දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර වෙත අභියාචනා කළ හැකිය. එම අභියාචනා සම්බන්ධයෙන් දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර තීරණය අවසානාත්මක තීරණය වන්නේය.**

අනුමත අංකය ...... 109
දකුණු ප. ළාත් ගරු ආණ්ඩුකාරතුමා
විසින් 2023. 06. 14 දින
සහතික කරමු.පිටු 70
2023. 06. 17

## 9. සියළු ස්ථාන මාරු සම්බන්ධයෙන් පොදු කොන්දේසි

9.1. **යම් සේවා ස්ථානයක සිට පරිපාලන ගැටළු/ ආයතනික ගැටළු/ විනය හේතු මත වෙනත් සේවා ස්ථානයකට ස්ථාන මාරු කරන ලද නිලධාරියෙකු නැවත එම සේවා ස්ථානයට ස්ථාන මාරු නොකළ යුතු ය.**

9.2. ආබාධිත තත්ත්වයේ හෝ බරපතල රෝගී තත්ත්වයන්ගෙන් පෙළෙන නිලධාරීන් ස්ථාන මාරු ඉල්ලුම් කරන්නේ නම්, එම නිලධාරීන් හට සුදුසු සේවා ස්ථාන ලබා දිය යුතු ය.

9.3. යම් නිලධාරියෙකුගේ කලත්‍රයා පොලීසියේ හෝ ත්‍රිවිධ හමුදාවේ උතුරු නැගෙනහිර ක්‍රියාන්විත රාජකාරියේදී පූර්ණ ආබාධිත තත්ත්වයට පත්ව ඇති බවට ලිඛිත සාක්ෂි ඉදිරිපත් කරන්නේ නම්, එම නිලධාරීන්ගේ ඉල්ලීම් අනුව ස්ථාන මාරුවීම් සිදුකළ යුතු ය. එසේම එවැනි නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් පිළිබඳව ප්‍රමුඛතාවය දැක්විය යුතු ය.

9.4. **ප්‍රියමනාප නොවන සේවා ස්ථානයන්හි සේවයේ නියුතු හා වෙනත් කාර්යාලයකට ස්ථාන මාරුවීම් අපේක්ෂා කළද ස්ථාන මාරු ලබා දිය නොහැකි නිලධාරීන් හට නවක නිලධාරීන්ට පත්වීම් ලබාදීමේදී ප්‍රමුඛතාවය ලබා දිය යුතු ය.**

9.5. ආබාධිත දරුවන්, දීර්ඝ කාලීනව අසනීප මත එක්තැන්ව සිටින කලත්‍රයන් හෝ දරුවන් සිටින නිලධාරීන්ට මුහුණදීමට සිදුවන විසඳාගත නොහැකි ගැටළු වලදී, පිළිගත හැකි කරුණු සහිතව තම දෙපාර්තමේන්තු ප්‍රධානී නිර්දේශයන් ද සමඟ ඉදිරිපත් කරන ඉල්ලීම් පිළිබඳව සැලකිල්ලට ගෙන කටයුතු කරනු ලැබේ.

9.6. සෑම නිලධාරියෙක් පිළිබඳව ම නිවැරදි හා සම්පූර්ණ තොරතුරු සැපයීමට ආයතන/ දෙපාර්තමේන්තු ප්‍රධානීන්/අමාත්‍යාංශ ලේකම්වරුන් වගබලා ගත යුතු ය.

9.7. (අ) ස්ථාන මාරුවීම් නියෝග ලැබ සිටින නිලධාරියෙකු එම ස්ථාන මාරුව ක්‍රියාත්මක වන දිනයෙන් පසු එම ආයතනයේ සේවයෙන් මුදා නොහැරීම ස්ථාන මාරුවීම් ප්‍රතිපත්තියට පටහැනි ය.

අනුමත අංකය ස්ථානමාරු / 09
ආත් ගරු ආචාර්යතුමා
2023.06.14 දින අනුමත කොට ඇති බව
සහතික කරමු. පිටු 70 කි.
2023.06.19
ආණ්ඩුකාර ලේකම්

(ආ) මෙම විධිවිධාන වලට පටහැනිව කටයුතු කරන ආයතන ප්‍රධානීන් හා අධීක්ෂණ නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කිරීම පිණිස අදාළ බලධරයා වෙත වාර්තා කරනු ලැබේ.

9.8. ස්ථාන මාරු වීම් අපේක්ෂා කරන නිලධාරීන්ගේ රාජකාරී කටයුතු කල් ඇතිව වෙනත් නිලධාරීන්ට පුහුණු කර ස්ථාන මාරු නියෝග නියමිත දිනට ක්‍රියාත්මක කරවීමට දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ අමාත්‍යාංශ ලේකම්වරුන් කටයුතු කළ යුතු ය.

9.9. ස්ථාන මාරුව ක්‍රියාත්මක කරන දින සිට මසක් ඇතුළත ඊට අදාළ තොරතුරු දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ මානව සම්පත් කළමනාකරණ මෙහෙයුම් පද්ධතියේ යාවත්කාලීන කළ යුතු ය.

9.10. ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2022.12.14 දිනැති අංක 2310/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්ය පරිපාටික රීති 1 වැනි කාණ්ඩයේ I වැනි පරිච්ඡේදයේ 11 රීතියේ විධිවිධාන අදාළ විය යුතු ය.

අනුමත අංකය ස්ථානමාරු / 09
2023.06.14 දින අනුමත කොට ඇති බව
70 සි.
2023.06.17

# 10. අර්ථ නිරූපණ

- **“පත්වීම් බලධරයා”** යන්නෙන් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2019 හා 2019.06.01 දිනැතිව නිකුත් කරන ලද දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් ම ක්‍රියාත්මක කරනු ලබන සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට හෝ වෙනත් නිලධරයෙකුට අභිනියෝජනය කරන ලද බලතල පැවරීම ප්‍රකාර ව පත්වීම් සම්බන්ධයෙන් බලතල පවරන ලද යම් නිලධාරියෙකු අදහස් කෙරේ.

- **“බලය අභිනියෝජිත බලධරයා”** යන්නෙන් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2019 හා 2019.06.01 දිනැතිව නිකුත් කරන ලද දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් ම ක්‍රියාත්මක කරනු ලබන සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට හෝ වෙනත් නිලධරයෙකුට අභිනියෝජනය කරන ලද බලතල පැවරීම ප්‍රකාර ව ස්ථාන මාරු ලබාදීම සම්බන්ධයෙන් බලතල පවරන ලද යම් නිලධාරියෙකු අදහස් කෙරේ.

- **“අමාත්‍යාංශ ලේකම්”** යන්නෙන් දකුණු පළාත් සභාවේ යම් අමාත්‍යාංශයක ලේකම් තනතුර දරන නිලධාරියා අදහස් කෙරේ.

- **“දෙපාර්තමේන්තු ප්‍රධානී”** යන්නෙන් දකුණු පළාත් සභාවේ යම් දෙපාර්තමේන්තුවක ප්‍රධාන තනතුර දරන නිලධාරියා අදහස් කෙරේ.

- **“ආයතන ප්‍රධානී”** යන්නෙන් දකුණු පළාත් සභාවේ යම් සේවා ස්ථානයක ප්‍රධාන තනතුර දරන නිලධාරියා අදහස් කෙරේ.

- **“නැවත සේවයේ පිහිටුවීම”** යන්නෙන් වැඩ තහනම් කර ඇති හෝ සේවයෙන් පහ කර ඇති හෝ පරිවාස පත්වීමක් අවසන් කර ඇති හෝ තනතුර හැර ගියා සේ සලකා ඇති හෝ තැනැත්තෙක් රජයේ සේවයේ තනතුරක යළි සේවයේ පිහිටුවීම අදහස් කෙරේ.

2023.06.14
70
2023.06.19

# 11. අන්තර්කාලීන විධිවිධාන

11.1. මෙම ස්ථාන මාරු පරිපාටිය බලාත්මක වීම ආරම්භ වන දිනට පූර්වාසන්නව බලාත්මකව පැවති විධිවිධාන යටතේ කරන ලද හෝ නිම නොවී පවත්නා හෝ ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් දෙනු ලැබූ විධානයන් හා ගනු ලැබූ සියලුම පියවර/ ක්‍රියාමාර්ගයන් මෙම ස්ථාන මාරු පරිපාටිය යටතේ කරන ලද සේ සැලකෙන අතර, ඒවා අඛණ්ඩව බලාත්මක වන්නේ ය.

11.2. එසේම ඒවා මෙම ස්ථාන මාරු පරිපාටිය යටතේ සම්පාදනය කරන ලද, නිකුත් කරන ලද, දෙන ලද හෝ කරන ලද හෝ ඒවා සේ සැලකෙන අතර අදාළ වෙනස්කම් සහිතව බලාත්මකව පවතින්නේ ය.

# 12. වෙනත්

12.1. මෙම ස්ථාන මාරු පරිපාටිය දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් අනුමත කරන දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

12.2. ස්ථාන මාරු සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව 2022.12.14 දිනැති අංක 2310/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්ය පරිපාටික රීති 1 වැනි කාණ්ඩයේ දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

12.3. දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් හෝ දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් ම ක්‍රියාත්මක කරනු ලබන සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට හෝ වෙනත් නිලධරයෙකුට අභිනියෝජනය කරන ලද බලතල පැවරීම් ප්‍රකාර ව, මෙම පරිපාටියයේ සඳහන් ඊට අදාළ කරුණු සංශෝධනය වේ.

12.4. මෙම ස්ථාන මාරු පරිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් දකුණු පළාත් ප්‍රධාන ලේකම් විසින් තීරණය කරනු ලැබේ.

12.5. දකුණු පළාත් සභාවේ කිසියම් දෙපාර්තමේන්තුවක් යටතේ පවතින සේවාවන් සඳහා ද, පළාත් අධිකාරීන් යටතේ සේවය කරන්නන් සඳහා ද, මෙවැනිම ස්ථාන මාරු ක්‍රමවේදයක් අනුගමනය කරමින් වාර්ෂික ස්ථාන මාරුවීම් සිදුකිරීමට කටයුතු කළ යුතු ය.

අනුමත අංකය ස්ථානමාරු / 09
දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා
2023.06.14 දින අනුමත කොට ඇති බව
කරමු.පිටු 70 කි.
2023.06.19

# 13. ආකෘති ලේඛනය

| ආකෘති අංකය | ආකෘති පත්‍රයේ නම | වගන්තිය |
|---|---|---|
| 01 | වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍රය | 4.6.3. |
| 02 | වාර්ෂික ස්ථාන මාරු අභියාචනා සමාලෝචන මණ්ඩලයට ඉදිරිපත් කිරීමේ අයදුම්පත්‍රය | 4.6.5. |
| 03 | වාර්ෂික ස්ථාන මාරු නියෝගය අනුව සේවයෙන් මුදා හැරීම | 4.6.B. |
| 04 | වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අභියාචනා ඉදිරිපත් කිරීමේ අයදුම්පත්‍රය | 4.7.(අ) |
| 05 | වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අභියාචනා ඉදිරිපත් කරන ලද නිලධාරීන්ගේ අනුප්‍රාප්තික නිලධාරීන් පිලිබඳ තොරතුරු ඉදිරිපත් කිරීමේ අයදුම්පත්‍රය | 4.7.(ආ) |
| 06 | CSS/03/06/ FO-3 වාර්ෂික නොවන ස්ථාන මාරු අයදුම්පත්‍රය | 7.1. හා 7.2. |
| 07 | වාර්ෂික නොවන ස්ථාන මාරු සම්බන්ධයෙන් දකුණු පළාත් ප්‍රධාන ලේකම් වෙත අභියාචනා ඉදිරිපත් කිරීමේ අයදුම්පත්‍රය | 8.1. |
| 08 | වාර්ෂික නොවන ස්ථාන මාරු සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කිරීමේ අයදුම්පත්‍රය | 8.2. |

අංකය ස්ථානමාරු 09
2023.06.14 දින අනුමත කොට ඇති බව
කරමු.පිටු 70 කි.
2023.06.19
ආණ්ඩුකාර ලේකම්

අංක 01 ආකෘතිය

## දකුණු පළාත් සභාව

## වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍රය - 2022

(වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය අවු: 05 හෝ ඊට වැඩි සියලුම නිලධාරීන් මෙම අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීම අනිවාර්ය වේ.)

| සේවය : | පන්තිය හා ශ්‍රේණිය : | දිස්ත්‍රික්කය : | අයදුම්පත් අංකය : |
|---|---|---|---|
| | | | |

| අ.) පෞද්ගලික තොරතුරු | | | |
|---|---|---|---|
| 01. සම්පූර්ණ නම | | | |
| 02. මුලකුරු සමග නම | | | |
| 03. මුලකුරු සමඟ නම (ඉංග්‍රීසියෙන්) | | | |
| 04. උපන් දිනය | | 05. ජා. හැ. ප. අංකය | |
| 06. ................. දිනට වයස | | 07. ස්ත්‍රී පුරුෂ භාවය | |
| 08.1 ස්ථිර ලිපිනය | | 08.2 තාවකාලික ලිපිනය | |
| 09.1 දුරකථන අංකය (කාර්යාලය) | | 09.2 දුරකථන අංකය (පෞද්ගලික) | |
| 10. විවාහක අවිවාහක බව | | 11. කලත්‍රයාගේ නම | |
| 12. කලත්‍රයාගේ රැකියාව හා සේවා ස්ථානය | | | |
| 13. දරුවන් ගණන | 13.1 ඔවුන්ගේ වයස (..................... දිනට) | 13.2. ඉගෙනුම ලබන පාසල් | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

අනුමත අංකය ස්ථානමාරු 09
... පාත් ගරු ආණ්ඩුකාරතුමා
විසින් 2023 . 06 . 14 දින අනුමත කොට ඇති බව
සහතික කරමු. පිටු 70 කි.
2023 . 06 . 14
ආණ්ඩුකාර ලේකම්

| | | | |
|---|---|---|---|
| **ආ.) සේවා තොරතුරු** | | | |
| 14.1 මුල් පත්වීම් දිනය | | 14.2 වර්තමාන තනතුරට පත් වූ / අන්තර්ග්‍රහණය වූ දිනය | |
| 14.3 වර්තමාන ශ්‍රේණියට උසස්වීම් ලැබූ දිනය | | | |
| 15.1 වර්තමාන නිත්‍ය සේවා ස්ථානය | | 15.2 නිත්‍ය සේවා ස්ථානයේ ලිපිනය | |
| 15.3 පිහිටි නගරය / උප නගරය | | 15.4 අනුයුක්ත කර ඇත්නම් එම සේවා ස්ථානය | |
| 15.5 වර්තමාන නිත්‍ය සේවා ස්ථානය අයත් අමාත්‍යාංශය / ආයතනය | | 15.6 දෙපාර්තමේන්තුව | |
| 16. දැනට රාජකාරී ඉටු කරනු ලබන අංශය | | | |
| 17. ඉටු කරනු ලබන විෂය රාජකාරීන් | | | |
| 18. ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම | | | |
| 19. සේවා කාලය තුලදී ලබා ඇති පුහුණුවීම් | පුහුණුව | ආයතනය | කාලසීමාව |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| 20. වර්තමාන සේවා ස්ථානයට වාර්තා කළ දිනය | | 21. ................. දිනට වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය | |

... ප්‍රශ්නමාලා 09
... ගරු ..... ආචාර්ය ... කුමාර ...
විසින් 2023.06.14 දින අනුමත කොට ඇති බව
සහතික කරමු. පිටු 70 කි.
2023.06.17

| 22. රජයේ සේවයේ පූර්ව සේවා ස්ථාන (වර්තමාන සේවා ස්ථානයේ සිට අනුපිළිවෙලින් සඳහන් කරන්න.) | | | |
|---|---|---|---|
| සේවා ස්ථානය | සේවා කාලය | | |
| | සිට | දක්වා | කාලය |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

**ඇ.) ස්ථාන මාරු ඉල්ලීම පිළිබඳ තොරතුරු (තම කැමැත්තේ අනුපිළිවෙළට සේවා ස්ථාන 05ක් සඳහන් කිරීම අනිවාර්ය වේ.)**

| 23. | සේවා ස්ථානය | ආසන්නතම නගරය / උප නගරය |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

24. ස්ථාන මාරු ඉල්ලුම් නොකිරීමට විශේෂ හේතු තිබේ නම් ඒවා සඳහන් කරන්න : (නිලධාරියා හෝ යැපෙන්නන් යම් ආබාධිත තත්වයකින් පෙළෙන්නේ නම් ඒ බවට **වෛද්‍ය සහතිකවලින්** තහවුරු කිරීමට යටත්ව මෙහි සඳහන් කරන්න./ වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක වන කාලය තුල **ප්‍රසූත නිවාඩු** යාමට **නියමිතව ඇත්නම්** ඒ බව සඳහන් කරන්න)

25. ඔබ 20....... වාර්ෂික ස්ථාන මාරුවීම් වලට යටත්ව ස්ථාන මාරුවීම ක්‍රියාත්මක නොවූයේ නම් එසේ වීමට හේතුව :

26. ඔබ ස්ථාන මාරු අපේක්ෂා නොකරන්නේ නම් ඊට හේතු :

27. ඉහත දක්වා ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවටත්, අසත්‍ය තොරතුරු වාර්තා කිරීමෙන් මට විරුද්ධව විනයානුකූලව කටයුතු කිරීමට හැකි බව දන්නා බවටත් සහතික වෙමි.

................................ ................................

දිනය අත්සන

අනුමත අංකය ස්ථානමාරු 09
[illegible] ආත් ගරු ආණ්ඩුකාරතුමා
විසින් 2023-06-14 දින අනුමත කොට ඇති බව
සහතික කරමු. පිටු 70 කි.
2023-06-
[illegible]

28. උක්ත නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුව භාර විෂය නිලධාරියා විසින් සම්පූර්ණ කළ යුතුය.

(අදාළ නිලධාරියාගේ සේවය) සේවයට / තනතුරට අයත් (අදාළ නිලධාරියාගේ ශ්‍රේණිය) හි සේවය කරන (අදාළ නිලධාරියාගේ මුලකුරු සහිත නම) විසින් ඉහත අනු අංක 01 සිට 27 දක්වා සම්පූර්ණ කර ඇති තොරතුරු ඔහුගේ/ ඇයගේ පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදි බවට සහතික කරමි.

විෂය භාර නිලධාරියාගේ නම :
තනතුර :
අත්සන :
දිනය :

**ඈ.) ආයතන ප්‍රධානියා/ දෙපාර්තමේන්තු ප්‍රධානියා/ අමාත්‍යාංශ ලේකම් නිර්දේශය**

29. පළාත් අධ්‍යක්ෂ/කොමසාරිස්
දකුණු පළාත් ............................. දෙපාර්තමේන්තුව.

i. (අදාළ නිලධාරියාගේ මුලකුරු සහිත නම) විසින් අනු අංක 01 සිට 27 දක්වා සම්පූර්ණ කර ඇති තොරතුරු ඔහුගේ/ඇයගේ පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදි බවට සහතික කරමි.

ii. (අදාළ නිලධාරියාගේ මුලකුරු සහිත නම)ගේ ස්ථාන මාරු ඉල්ලීම අනුප්‍රාප්තිකයෙකු (සහිතව/ රහිතව/පසුව ලබා ගැනීමේ පදනම මත) නිර්දේශ කරමි / නිර්දේශ නොකරමි.

............................... ...............................................
දිනය ආයතන ප්‍රධානියාගේ
අත්සන හා නිල මුද්‍රාව

30. ලේකම්,
දකුණු පළාත් ........................... අමාත්‍යාංශය.

i. (අදාළ නිලධාරියාගේ මුලකුරු සහිත නම) විසින් අනු අංක 01 සිට 27 දක්වා සම්පූර්ණ කර ඇති තොරතුරු ඔහුගේ/ඇයගේ පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදි බවට සහතික කරමි.

ii. (අදාළ නිලධාරියාගේ මුලකුරු සහිත නම) ගේ ස්ථාන මාරු ඉල්ලීම අනුප්‍රාප්තිකයෙකු (සහිතව/ රහිතව/ පසුව ලබා ගැනීමේ පදනම මත) නිර්දේශ කරමි / නිර්දේශ නොකරමි.

................................ .................................................
දිනය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන හා නිල මුද්‍රාව

31. ප්‍රධාන ලේකම්, දකුණු පළාත.

i. (අදාළ නිලධාරියාගේ මුලකුරු සහිත නම) විසින් අනු අංක 01 සිට 27 දක්වා සම්පූර්ණ කර ඇති තොරතුරු ඔහුගේ/ඇයගේ පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදි බවට සහතික කරමි.

ii. (අදාළ නිලධාරියාගේ මුලකුරු සහිත නම) ගේ ස්ථාන මාරු ඉල්ලීම අනුප්‍රාප්තිකයෙකු (සහිතව/ රහිතව/ පසුව ලබා ගැනීමේ පදනම මත) නිර්දේශ කරමි / නිර්දේශ නොකරමි.

................................ .................................................
දිනය අමාත්‍යාංශ ලේකම්ගේ
අත්සන හා නිල මුද්‍රාව

අනුමත අංකය ස්ථානමාරු 09
විසින් 2023.06.14 දින අනුමත කොට ඇත.
සහතික කරමු පිටු 70 කි.
2023.06.19
ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

ආකෘති අංක 02

## වාර්ෂික ස්ථාන මාරු අභියාචනා සමාලෝචන මණ්ඩලයට ඉදිරිපත් කිරීමේ අයදුම්පත්‍රය

| සේවය : | පන්තිය හා ශ්‍රේණිය : |
|---|---|

01. සම්පූර්ණ නම:-....................................................................................................................
